ප්‍රයිම් ග්‍රාමීන්

# මෙහෙවර

අඳුර දුරලන සොඳුරු මෙහෙවර

3 කාණ්ඩය - හයවන කලාපය - 2015 ජනවාරි




නැවුම් යුගයක නැවුම් අරුණළු කිරණ විහිදී දැයේ සිව්දෙස
නැවුම් පැතුමන් එකලු කර සිත් පුබුදුවා දිරි වඩන ජයගොස
හෙටත් මේ බිම සරන්නට දුක දිනන මිනිසුන් සොයා දසදෙස
තනාපන් දිරිලියේ මිරිවැඩි දෙකක් දෙපයේ නිවන සරතැස
- මංජුල

නිරූපනය : ජී. නිර්මලා ප්‍රියදර්ශිකා මහත්මිය
ප්‍රයිම් ග්‍රාමීන් අම්පාර ශාඛාවේ සාමාජිකා
ඡායාරූප : ලක්ෂමන් කුමාරතුංග

# ඔබ (නො)දන්න මම



# මගේ එස්. අයි. සිහිනය එතැනම බොඳවෙලා ගියා...

## සුජිත් කුමාර - ප්‍රාදේශීය කළමනාකරු කොළඹ ප්‍රාදේශිකය

සම්පූර්ණ නම :- ඊශ්‍රාචාව්ගේ සුජිත් කුමාර

උපන් දිනය :- 1980.08.29

පාසැල් කාලයේ ඔබේ ප්‍රියතම පාසැල :- මම ඉස්කෝල දෙකකට ගියා. එයින් සාමාන්‍ය පෙළ දක්වා මහවිල කණිෂ්ඨ විද්‍යාලයටත්, උසස්පෙළ සඳහා පානදුර රාජකීය විද්‍යාලයටත් ගියා. මේ පාසැල් දෙකින් මම වඩාත්ම කැමැති මහවිල කණිෂ්ඨ විද්‍යාලයට. ඒකට එක හේතුවක් වෙන්නෙ පාසැල් කාලයෙන් වැඩිම කාලයක් ගත කළේ එම පාසැලේ වීම.අනෙක ඒක මිශ්‍ර පාසැලක් . ඒ නිසාම හුඟාක් සුන්දර අත්දැකීම් රැසක් ඒ කාලය තුළ ජීවිතයට එකතු වුණා.

විෂය :- ගණිතයට මගේ විශේෂ කැමැත්තක් ඒ කාලේ ඉඳලා තිබුණා

ක්‍රීඩාව :- සාමාන්‍ය පෙළ වෙනකම් මළල ක්‍රීඩා කළා. ඉන් පස්සෙ උසස් පෙළ පංතිවල ඉන්දැද්දි රගර් ක්‍රීඩාවට වැඩි කැමැත්තක් දැක්වුවා.

පාසැල් කාලයේදී ලොකු වුණාම වෙන්න හිතන් හිටියේ :- පොඩි කාලේ ඉඳන් මගේ හිතේ තිබුණු ආශාවක් තමයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂකයෙක් වෙන එක (C.I.D. ) 2000 වසරෙදි (උසස් පෙළ ඉවරවෙලා) මම ඉන්ටර්විව් එකට පෙනී හිටලා අවසන් 50 දෙනා අතරටත් තේරුණා. එහෙම තියෙද්දි ඔය අතරෙම තිබුණු ඡන්දයකින් පස්සෙ හිටපු පොලිස් පතිතුමත් මාරු වෙලා රටේ දේශපාලන වාතාවරණය වෙනස් වුණා. ඒ ඡන්දෙන් පස්සෙ අපේ පත්වීම් යට ගියා. මගෙ S.I සිහිනය එතැනම බොඳවෙලා ගියා.



ආපු කාරණේ කිව්වා විතරයි ඒ මනුස්සයා කැත්තක් අරන් ආවා කොටන්න

දුව ලැබුණු දවස මගේ ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දවසයි...

ආදරය පිළිබඳ සැබෑ හැඟීමක් ඇතිවුණේ 2002 දී... දැන් ඇය...

මුල්ම ජොබ් එක හොයාගන්න වින්ද දුක :- ජොබ් එකක් හොයාගන්න එහෙම ලොකු කට්ටක් කන්න වුනේ නෑ.මොකද සාමාන්‍යපෙළ කරලා ප්‍රතිඵල එනකල් ගෙදර උන්න කාලෙම මම ජොබ් එකක් කරන්න පටන් ගත්තා. උසස් පෙළින් පස්සෙත් නැවතත් මට එතැනටම රැකියාවට යන්න පුළුවන් වුණා.එහෙම අවුරුදු තුන හතරක් වෙන තැන්වල වැඩ කරමින් ඉන්න අතරෙදි තමයි ප්‍රාදේශීය කළමනාකරු චමින්ද සම්පත් මහතාගේ මාර්ගයෙන් ග්‍රාමීන් සමාගමට එන්න ලැබුණෙ ක්ෂේත්‍ර විධායකවරයෙක් විදිහට

ග්‍රාමීන් ජීවිතේ අමතක නොවන සිද්ධිය :- අමතක නොවන සිද්ධීන් නම් ගොඩක් තියෙනවා. එකපාරට මගේ මතකයට එන සිද්ධියක් කිව්වොත් එක දවසක් හවස අපි ණය මුදලක් එකතු කරගන්න සාමාජිකාවකගෙ ගෙදරකට ගියා. එතකොට මම නැවත අය කර ගැනීමේ නිළධාරී විදිහට තමයි වැඩ කළේ. අපි යනකොට සාමාජිකාව ගෙදර හිටියේ නෑ. අපි ආපු කාරණේ එයාගෙ මහත්තයාට කිව්වා විතරයි ඒ මනුස්සයා පරල වුණා වගේ එක පාරටම කැත්තක් උස්සන් ආවා අපිට කොටන්න. හොඳ වෙලාවට දුවාගන්න වෙලාව තිබුණු නිසා හොඳයි. පස්සෙ තමයි දැන ගන්න ලැබුණෙ ඒ මනුස්සයාට පොඩි මොළේ අමාරුවක් තියෙනවා කියලා.

ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දිනය සහ දුකට පත්වුණු දිනය :- මගේ දුව හම්බවුණු දවස තමයි මගේ ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දවස. වැඩිම දුකක් හිතට දැනුණෙ සාමාන්‍ය පෙළ ඉවරවෙලා වෙනත් පාසැලකට යන්න එතකල් ගිය පාසැලෙන් අස්වුණු මොහොතෙ

අතීතයට යාමට වරමක් ලැබුනොත් ඔබ තෝරාගන්නා ජීවිතේ හොඳම කාලය සහ ඊට හේතුව :- පාසැලේ 9 වසර පංතියේ සිට 11 වසර පංතිය දක්වා වූ කාල සීමාව ජීවිතේ හොඳම කාලය විදිහටයි මම දකින්නේ. බොහොම සැහැල්ලුවෙන් සහ විනෝදයෙන් ගත කරපු ඒ වගේ කාලයක් නැවත ආපහු එන එකක් නෑ.

ග්‍රාමීන් සමාගමේ සේවය කරන හොඳම ශාඛා කළමනාකරුවන් පස්දෙනා තෝරන විනිශ්චය මණ්ඩලයක සාමාජිකත්වය ඔබට හිමිවුනොත් විනිශ්චය ලබාදීම සඳහා ඔබ සලකා බලන ඔවුන්ගේ ගුණාංග :-

1. තමන්ගෙ යටතේ සේවය කරන තම නිළධාරීන්ට හොඳින් සලකන නායකයකු විය යුතුයි.
2. තීරණ ගැනීමේදී ගොඩක් දුරට සාමූහිකව සිතා තීරණ ගන්න ගන්නා පුද්ගලයකු වීම
3. ලබා දී ඇති ඉලක්ක සපුරාලීම සඳහා ක්‍රියාකර ඇති ආකාරය

දේව වරමකින් ඔබට වරතුනක් ලැබුනොත් ඔබ දෙවියන්ගෙන් ඉල්ලන්නේ :- මම කරපු සමහර දේවල් ගැන පසුව පසුතැවිලි වෙන්නට සිදු වූ අවස්ථා තියෙනවා. ආපහු අතීතෙට ගිහින් ඒ දේවල් නිවැරදි කර ගන්න අවස්ථාවක් ලැබෙනවානම් මම දෙවියන්ගෙන් ඒ වරය ඉල්ලනවා. මම හුඟක් සංවේදියි හැබැයි ඉක්මණින් කේන්ති යනවා.ඒ කේන්තිය පාලනය කර ගන්න වරමක් ඉල්ලනවා. ඉන්න තත්වයට වඩා හොඳින් සමාජයට සහ මගේ අයට සලකගන්න පුළුවන් ආර්ථික තත්වයක් ලබා දෙන්න කියලා ඉල්ලනවා.

හරි ගස්සා ගන්න අවස්ථාවක් ලැබුනොත් ඔබ වෙනස් කරගන්නා ඔබේ දුර්වලතා :- දේවල් කරලා සමහර වෙලාවට ඒ ගැන දිගින් දිගටම සිතමින් පසුතැවිලි වෙනවා. මේ තත්වය නැතිකර ගත හැකිනම්.....

රටේ නීති ක්‍රියාත්මක කරවීමේ විධායක බලතල ඔබට හිමිවුනොත් මුලින්ම ක්‍රියාවට නංවන නීතිය :- සමාජ අසාධාරණයට එරෙහිව රටේ ක්‍රියාත්මක නීතිය ප්‍රමාණවත් නෑ කියන එකයි මගේ අදහස. අනෙක තියෙන නීතිය වුනත් ක්‍රියාත්මක වීමේදී බොහෝ අඩුපාඩු තියෙනවා.නීතිය ක්‍රියාත්මක කරන ආයතන වලට මධ්‍යස්ථව හිඳිමින් කටයුතු කිරීමට අවශ්‍ය නීති සම්පාදනය විය යුතුයි.

පළමු ආදර අත්දැකීම ජීවිතයට බලපෑ අන්දම :- සාමාන්‍ය පෙළ විභාගෙ ඉවර වුණාම ගෑණු ළමයෙක් මගෙන් ඇහැව්වා යාළු වෙන්න. ඇය පිළිබඳව මගේ හිතෙත් පොඩි පැහැදීමක් තිබුණා. ඉතින් මමත් කැමැති වුණා. ඒත් ඒක දුර දිග ගිය එකක් වුණේ නෑ. ආදරය පිළිබඳ සැබෑ හැඟීමක් මට ඇතිවුණේ 2002 දී එතකොට මම ජොබ් එකක් කරනවා. ඇය නදීකා ගීතාංජලී ප්‍රනාන්දු. දැන් ඇය මගේ බිරිඳ

ඔබේ ප්‍රියතම ගායකයා :- එච්.ආර්. ජෝතිපාල

ගීතය :- එක ගීතයක් කියලා කියන්න බෑ

චිත්‍රපටිය :- සෙලියුලර්

කෘතිය :- මගේ බිරිඳ ලියු පොතක් තියෙනවා "නෙතු කඳුල" කියලා.ඒ පොතට මම කැමැතියි

අනාගත ඉලක්කය :- පෞද්ගලික ජීවිතයෙ නම් හොඳ ගෙයක් දොරක් හදාගෙන සතුටින් ජීවත්වීම.රැකියාවෙ නම් උසස් වීම් ලබමින් ආයතනයට හැකි උපරිම සේවයක් කිරීම.

සටහන
මංජුල හෙට්ටිආරච්චි

# ප්‍රයිම් ග්‍රාමීන් සමාගම "Asia's Most Promising Brand 2014" සම්මානයෙන් පිදුම් ලබයි







ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම සමාගමක් වන ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆයිනෑන්ස් සමාගම, ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් සිදුකරන ලද අනුපමේය දායකත්වය ඇගයීමට ලක්කරමින් ලෝක උපදේශන සහ සමීක්ෂණ ආයතනය World Consulting and Research Corporation (WCRC)) මගින් 2014 ජනවාරි මස 12 වන දින පවත්වන ලද සම්මාන උළෙලේදී "Asia's Most Promising Brand 2014" සම්මානය ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆයිනෑන්ස් සමාගම වෙත ප්‍රදානය කරන ලදි. හැටන් නැෂනල් සමූහ ව්‍යාපාරයේ අනුබද්ධ සමාගමක් වන ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆයිනෑන්ස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක සහ ප්‍රධාන විධායක නිලධාරී චමින්ද ප්‍රභාත් මහතා මෙහිදී "WCRC Leader of The Year 2014"(Game Changer of The Year 2014 –Business) සම්මානයෙන් පිදුම් ලැබූ අතර උක්ත සම්මාන උළෙලේදී ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ සහකාර සාමාන්‍යාධිකාරී රමේෂ් ෆොන්සේකා මහතාට "Diverse Continent, Dynamic Possibilities, and Marketing Challenges in Asia" සම්බන්ධයෙන් වූ සාකච්ඡාවක් සඳහා මණ්ඩල සභිකයකු වශයෙන් එක්වීමට ඇරයුම් ලැබී ඇත.

"Asia's Most Promising Leader 2014" සම්මාන උළෙල මෙහෙයවන ලද්දේ ඉන්දියාවේ පිහිටි World Consulting and Research Corporation (WCRC) මගින් වන අතර එකී ආයතනය එක්සත් රාජධානිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිංගප්පූරුව සහ ඕස්ට්‍රේලියාව යන රටවලද සමීක්ෂණ සහ උපදේශන ආයතනයක් වශයෙන් ප්‍රසිද්ධියට පත්ව ඇත. එසේම විවිධ අංශ නියෝජනය වන පරිදි එකී සම්මාන උළෙලේදී සමාගම් 150 ක් සම්මාන ලැබූ අතර ' ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය සමාගමක් විසින් මෙවන් සම්මානයක් ලද ප්‍රථම අවස්ථාව මෙය ලෙස වාර්තා වේ.

එසේම මෙම සම්මානය සඳහා ආසියාවේ සමාගම් 15000 පමණ තෝරාගනිමින් අදියර දෙකකින් අධීක්ෂණයකට ලක්කර ඇති අතර එහි ප්‍රථම අදියරේදී එකී ආයතනයේ මණ්ඩලයක් විසින් පුළුල් සමීක්ෂණයක් සිදු කරමින්ද දෙවන අදියරේදී විවිධ විෂය ක්ෂේත්‍රයන්ගෙන් සැදුම් ලත් ප්‍රබුද්ධ සහ කීර්තිමත් නිරීක්ෂණ මණ්ඩලයක අධ්‍යයනයටද භාජනය කරන ලදි. ඉන්පසු එකී අදියර දෙකෙහිම ලකුණු ඉන්දියාවේ පිහිටි KPMG විගණකාධිකාරී ආයතනය මගින් අගයමින් 2014 වසර සඳහා වූ අවසාන සම්මානලාභීන් 150 දෙනා තෝරාගන්නා ලදි.

**ජයග්‍රහනයට මුල දැරූ වෑයමයි. දැරූ වෑයමෙන් තොර ජයක් නැත.**

# ප්‍රයිම්ග්‍රාමීන් ශාඛාවක වගතුග




ඓතිහාසික උරුමයන් රැසක හිමිකම දරාගත් දිගාමඬුල්ල ඒ අතීත උරුමයේ වගතුග අදටත් නිහඬව දරාගෙන සිටිනුයේ අතිමහත් ආඩම්බරයකිනැයි මට සිතේ. බැලූ බැලූ අත දිස්වන නිල්වන් කුඹුරු යායන්ගෙන් දිසෙන චමත්කාරය හා ඒ චමත්කාරය බිහිකළ මිනිසුන්ගේ ගත දහදිය සුවද හද විනිවිදින පවන් රොදක් සේ නිබදව හදවත ආශ්වාදයෙන් පුරවාලයි.කළු පීත්තපටියක් සේ දුර ඈතට දිස්වන කොළඹ අම්පාර මහාමාර්ගයේ එකින් එක පසුවන කිලෝ මීටර් කණු අප ගමනාන්තයට ළඟාවෙමින් සිටිනා වග කියාපානුයේ ගොළු බසිනි . අම්පාර ග්‍රාමීන් ශාඛාවක් ස්ථාපිත වනුයේ මීට වසර 13කට පෙරාතුව 2002 වසරේදීය. ඒ අම්පාර නගරයේ 4 මාවතේ අංක 3 දරණ තැනය. ප්‍රයිම් ග්‍රාමීන් ශාඛා ලැයිස්තුවේ 07 වන ශාඛාව වූ අම්පාර ශාඛාවේ වගතුග අප සමඟ පවසන්නට එක් වූ එහි ශාඛා කළමනාකරු වූ අරවින්ද අකලංක ඩි සිල්වා මහතා ප්‍රයිම් ග්‍රාමීන් දැක්ම යථාර්තයක් බවට පත් කරන්නට සිය කාර්ය මණ්ඩලය සේවා දායකත්වය දක්වන අන්දම අප හමුවේ තැබුවේ මෙසේය.

" අම්පාර කියන්නෙ ව්‍යාපාර විශාල සංඛ්‍යාවක් සංකේන්ද්‍රණය වුණු ප්‍රදේශයක් නෙවෙයි . අම්පාරෙ වැඩිපුරම දකින්න තියෙන්නෙ වගාවන් . විශේෂයෙන් වී වගාව ,පැල තවාන් වගේ ඊට අමතරව මේ ප්‍රදේශයේ දකින්න පුළුවන් ව්‍යාපාර අතර , ධීවර කර්මාන්තය, සත්ව පාලනය, (කුකුලන් ගවයින් වැනි) සහල් වෙළෙදාම (ඉරිඟු, එළවළු)නිමි ඇදුම් ආශ්‍රිත නිශ්පාදන, ධාන්‍ය වර්ග පැකට් කිරීම හා බැඳුණු ව්‍යාපාර සහ සිල්ලර කඩ , ආදිය ප්‍රධානයි. අපේ සාමාජිකාවන් මේ විවිධ තරාතිරමේ වගාවන් වල සහ ව්‍යාපාරවල නිරත වෙනවා. ඒ වගේමයි අපේ මධ්‍යස්ථාන පැතිරී ඇති ප්‍රදේශය ඉතා විශාලයි. . සමාගමක් වශයෙන් හා ශාඛාවක් වශයෙන් අම්පාර ප්‍රදේශයේ අවුරුදු 12 ඉක්මවා ග්‍රාමීන් සංකල්පයේ ගුණාත්මක බව ප්‍රමාණාත්මකව සිදුවූ වර්ධනයට සමාන්තරව රදවාගෙන ඉදිරියට ගිය ප්‍රධානතම ක්ෂුද්‍ර මූල්‍ය සමාගම බවට අප පත්ව සිටිනවා. විශේෂයෙන් සාමාපිකාව ඉල්ලන ණය මුදල නොව අවශ්‍ය හා උවමනා කරන ප්‍රමාණය පමණක් ඇස්තමේන්තු කර ලබා දෙන ප්‍රධාන පෙළේ සමාගම බවට ප්‍රයිම් ග්‍රාමීන් පත්ව සිටිනවා.විශේෂයෙන් ආයතනයේ නාමය ඇසු සැනින් ක්ෂේත්‍රයේ පවතින අනෙකුත් සමාගම් හා අප සමාගමේ මෙහෙයුම් ක්‍රියාවලීන්හි වෙනස සාමාපිකයින් හොදින් හදුනනවා. එම නිසයි නැවත නොගෙවීමේ සංඛ්‍යාව තනි ඉලක්කමක පවත්වා ගැනීමට මේ වනතෙක්ම අපට හැකිවී තිබෙන්නේ.

අපේ නිළධාරීන්ට සැතපුම් හැට හැත්තෑව දුර ඉන්න අපේ සාමාජික පවුල් වෙත ගිහින් හැකි උපරිම අයුරින් අපගේ සේවාවන් ලබාදීමට සිදුවී තිබෙනවා.මෙය ප්‍රායෝගිකව තරමක් දුෂ්කර කටයුත්තක්. මේ නිසා පොතුවිල් වැනි අම්පාරට දුරින් පිහිටි ප්‍රදේශ ආවරණය කිරීම පිණිස ඔවුන්ට ව්‍යාපාර පවත්වාගෙන යාමට වගේම අළුතින් ව්‍යාපාර ආරම්භ කිරීමටත් අවශ්‍ය ණය පහසුකම් හා උපදෙස් ලබාදීමත් යන කාරණා වඩාත් පහසුවෙන් කරගෙන යාම පිණිස අම්පාර ශාඛාව යටතේ පානම අපගේ සේවා මධ්‍යස්ථානයක් ස්ථාපිත කර තිබෙනවා.

## අම්පාර ශාඛාවේ නිළධාරී මණ්ඩලය

**ප්‍රාදේශීය කළමනාකරු**
ප්‍රියන්ත දිසානායක

**ශාඛා කළමනාකරු**
අරවින්ද අකලංක සිල්වා

**සහකාර කළමනාකරු**
එස්.එම් චන්ද්‍රසේන

**ශාඛා ගිණුම් ප්‍රධානි**
ශාන්ත සෙනෙවිරත්න

**ක්ෂේත්‍ර කළමනාකරු**
නුවන් දමිත්

**ක්ෂේත්‍ර විධායකයින්**
වරුණ දසනායක
රසික සම්පත්
පියල් නන්දන විජේසිංහ
සුමේධ ප්‍රනාන්දු
තරංග උදය කුමාර
පී. සංජීත්
කේ ජේයකුමාර්
ටී. තවනේෂ්වරන්

**ගිණුම් සහායක**
දිනූෂා කේෂාණී
රකීබ් මොහොමඩ් ඉස්මත්
චතුරංග ශ්‍රීනාත්

**ඉතුරුම් විධායක**
ඩිලංක නිරෝෂන්

## පොතුවිල් සේවා මධ්‍යස්ථානයේ නිළධාරී මණ්ඩලය

**සහකාර කළමනාකරු**
උපුල් ශාන්ත කුමාර

**ක්ෂේත්‍ර කළමනාකරු**
ධර්මාශෝක ඩි. සිල්වා

**ජ්‍යේෂ්ඨ ගිණුම් සහායක**
ජයසිරි බණ්ඩාර

**ක්ෂේත්‍ර විධායක**
කපිල සෙනෙවිරත්න
ජෙම්සිත් මොහොමඩ්
ප්‍රියන්ත කුමාර
තුෂාර හේෂාන්
එන්. වාගීශන්
මොහොමඩ් ෆාරුක් රිෆඩීන්

**ගිණුම් සහායක**
ප්‍රබාද් කුමාර

# ග්‍රාමීන් සංකල්පයේ ගුණාත්මක බව ඉදිරියට ගෙන ගිය ප්‍රධානතම ක්ෂුද්‍ර මූල්‍ය සමාගම බවට අප පත්ව සිටිනවා

ප්‍රයිම් ග්‍රාමීන් අම්පාර ශාඛාව



ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ අම්පාර ශාඛාවේ කාර්ය මණ්ඩලය



ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ පොතුවිල් සේවා මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය

සටහන - මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි
ඡායාරූප - ලක්ෂමන් කුමාරතුංග



**ප්‍රියන්ත දිසානායක**
ප්‍රාදේශීය කළමනාකරු



**අරවින්ද ඩි. සිල්වා**
ශාඛා කළමනාකරු



**එස්. එම්. චන්ද්‍රසේන**
සහකාර කළමනාකරු



**උපුල් ශාන්ත කුමාර**
සහකාර කළමනාකරු



**නුවන් දමිත්**
ක්ෂේත්‍ර කළමනාකරු



**ධර්මාශෝක ඩි. සිල්වා**
ක්ෂේත්‍ර කළමනාකරු



**ශාන්ත සෙනෙවිරත්න**
ශාඛා ගිණුම් ප්‍රධානි



**ජයසිරි බණ්ඩාර**
ගිණුම් සහායක

**ප්‍රධානියා කීදේ අවසන්වූ පසු ඔබේ යෝජනාව ඉදිරිපත් කරන්න.**

අද වන විට අපේ මධ්‍යස්ථාන 192( පානම සේවා මධ්‍යස්ථානයද ඇතුළුව) සාමාජිකාවන් 7026කට ණය පහසුකම් ලබා දී තියෙනවා. ඔවුන්ගේ ව්‍යාපාර සදහා නිකුත් කර ඇති ණය මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 584 ක් අම්පාර ශාඛාව මගින් මෙහෙයවනු ලබන මධ්‍යස්ථාන විශාල ප්‍රදේශයක් පුරා විහිදී පැතිරී තියෙනවා. අම්පාර සිට නුවර පාරේ ගොනාගොල්ල දක්වාත් අම්පාර ඉඟිනියාගල හරහා මොනරාගල පාරේ ඉඟිනියාගල දක්වාත් අම්පාර හිඟුරාණ මාර්ගයේ පන්නලගම දක්වා සහ අම්පාර කල්මුණේ මාර්ගයේ සමන්තුරෙයි හා නින්දවූර් දක්වා ප්‍රදේශය තුළත් අපේ මධ්‍යස්ථාන ස්ථාපිත කර තියෙනවා. මේ මධ්‍යස්ථාන හරහා සුළු ව්‍යාපාර සඳහා අප සමාගමේ සාමාජිකත්වය ලබාගන්නා සාමාජිකාවන්හට ණය මුදල් ලබාදෙනවා. ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ් මගින් හදුන්වාදී ඇති ඉතුරුම් ක්‍රම වූ "යාළු"ළමා ඉතුරුම් ගිණුම මියුලැසි කාන්තා ඉතුරුම් ගිණුම සහ ප්‍රයිම් ඉතුරුම් ගිණුම යන ගිණුම් ක්‍රම සියල්ලත් අපේ ශාඛාවෙහි ක්‍රියාත්මකයි. සාමාජිකාවන් ගේ එදිනෙදා අවශ්‍යතා සදහා ක්ෂණිකව ලබාදෙන "සහන ණය " ණය ක්‍රමය යටතේ අපේ සාමාජිකාවන්ගේ දූ දරුවන්ගෙ අධ්‍යාපනික අවශ්‍යතා එදිනෙදා වියදම් ආදියට යම් පිළිසරණක් වීමට අපි කටයුතු කරනවා.මේ යටතේ පසුගිය කාලය තුළ රුෑමිඃ 38 මුදලක් සහන ණය වශයෙන් අපි ලබාදුන්නා. සාමාජිකාවන්ගේ සහ ඔවුන්ගේ පවුලේ උදවිය වෙනුවෙන් සලසා ඇති සාමාජිකාව සහ ණය ආරක්ෂණ අරමුදල යටතේ සාමාජිකාවන් 53 දෙනකු සඳහා මරණාධාර සහ වන්දි මුදල් වශයෙන් රුපියල් 1613035 මුදලක් ලබාදීමට පසුගිය කාලය තුළ අපි කටයුතු කළා.

ලංකාවේ පුරෝගාමී මයික්‍රෝ ෆිනෑන්ස් සමාගම විදිහට ව්‍යාපාරික වශයෙන් වගේම සමාජ සත්කාර්යයක් ලෙසත් මේ කාර්යයන් ඉටු කිරීමට අපි නිරන්තරව වෙහෙසෙනවා. අපේ සාමාජිකාවන් සඳහා අභිප්‍රේරණ වැඩසටහන් සංවිධානය කිරීමටත් ඔවුන්ගේ ව්‍යාපාර වර්ධනය කිරීම සඳහා වගේම ඔවුන් මුහුණ දෙන ගංවතුර නියං වගේ ස්වාභාවික ආපදා වලදීත් අපි අපේ සාමාජිකාවන්ට සහ ඔවුන්ගේ පවුල් වලට පිළිසරණය වෙමින් ඔවුන්ගේ ජීවිත ඔසවා තැබීමට කටයුතු කරනවා. මේ නිසාම වසර ගණනක් පුරා අප ආයතනය සමග බැඳී කටයුතු කරන සාමාජිකාවන් අද වගේම හෙටත් ප්‍රයිම් ග්‍රාමින් සමාගම සමඟ එක්ව ඔවුන්ගේ ජීවිතය සාර්ථක කර ගැනීමේ අරමුණින් කටයුතු කරනවා."

| මධ්‍යස්ථාන සංඛ්‍යාව | සාමාජික සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව | නිකුත් කළ ණය ප්‍රමාණය රු. |
|---|---|---|---|
| 192 | 7026 | 26 | රු. මි. 584 |

**ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්**
**අංක 27, නිදහස් මාවත**
**අම්පාර.**
**දුරඃ 0632224379**
**ඊ මේල්** ampara@primegrameen.lk






## කිසිම බැංකුවක් අපිට ණය මුදලක් නොදුන් මොහොතක අපිට අත දුන්නෙ ග්‍රාමින් සමාගම

අපි ලී බඩු නිශ්පාදනය කිරීම පටන් අරන් දැන් අවුරුදු 26කටත් වැඩියි. මහත්තයා තමයි ව්‍යාපාරය පටන් ගත්තේ. එයා ගාව තව කීප දෙනෙක්ම වැඩ කළා. විශේෂයෙන්ම අල්මාරි, ඇඳන්, කබඩ්, කණ්නාඩි මේස වගේ ඕනෑම වර්ගයක ලී බඩුවක් හදන්න අපිට පුළුවන්. ග්‍රාමීන් සමාගමට අපි සම්බන්ධ වුණේ මීට අවුරුදු 09 කට විතර කලින්. දැන් අපි වයසයි. අපේ වයසත් එක්ක හුඟාක් බැංකු මුල්‍ය ආයතන අපිට ණය මුදලක් ලබා දෙන්න ඉදිරිපත් වෙන්නෙ නෑ. ඒ වගෙ අවස්ථාවක තමයි අපිට ග්‍රාමීන් සමාගම ගැන දැනගන්න ලැබුණේ. ඔවුන් අපේ ව්‍යාපාරය පිළිබඳව සොයාබලා ණය මුදලක් ලබා දෙන්න තීරණය කළා. මුල් ණය මුදලේ ඉඳලාම මම දිගින් දිගටම ණය මුදල් ලබා ගත්තා.. අපි දැන් ගොඩක්ම ලී බඩු හදන්නෙ ඇණවුම් වලට. මේ නිසා දැන් නිතරම ණය මුදල් ගන්න අවශ්‍ය නොවුණත් අපි ග්‍රාමින් සමාගම සමඟ ඉන්නෙ සමාගම අපිට දක්වපු අනුග්‍රාහය අමතක කරන්න බැරි නිසයි.

**මොනිකා පෙරේරා**
**විජය මාවත, අම්පාර.**

## ග්‍රාමින් සමාගම අපිත් එක්ක ඉන්නවාය කියන සිතුවිල්ලත් අපිට හයියක්...

දැන් අවුරුදු දෙකක් විතර වෙනවා මම පාවහන් නිෂ්පාදනය ව්‍යාපාරයක් විදිහට පටන් අරගෙන. ළමා කාන්තා පාවහන් වර්ග වගේම පිරිමි පාවහන් වර්ගත් යම් තරමකට කරනවා. හදන සපත්තු සෙරෙප්පු වෙනම කඩවලට දාන්නෙ නෑ. මොකද වැඩිපුර අපි පාවහන් හදන්නෙ ඇණවුම් වලට. ලැබෙන ඇණවුම් ප්‍රමාණය ප්‍රමාණවත් නිසා පිට කඩ වලට දාන්න තරම් ඉඩක් තවම ලැබිල නෑ. 2013 දී මම ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වුණේ පාවහන් නිශ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී මුදල් ප්‍රශ්නය ප්‍රධාන ගැටලුවක් වෙලා තිබුණු නිසයි. දැන්නම් දෙයියන්ගෙ පිහිටෙන් ඒ ගැන සිතමින් ලතවෙන්න උවමනාවක් නෑ. මුදල් අවශ්‍ය වෙලාවක පිහිටට ග්‍රාමීන් සමාගම අපිට ඉන්නවාය කියන සිතුවිල්ල අපි වගේ පුංචි ව්‍යාපාරිකයන්ට ඉතාම වටිනවා.

**ජී. නිර්මලා ප්‍රියදර්ශිකා,**
**වරංගනා ෂූ පැලස්,**
**බටහිර පානම, පානම.**



## ව්‍යාපාරය ඉහළට ගන්න මුදල් අවශ්‍ය වුණු වෙලාවක තමයි මට ණය මුදලක් ගන්න තැනක් අවශ්‍ය වුනේ...

ව්‍යාපාරයක් පිළිබදව මුලික සිතුවිල්ලක් මුලින් මට තිබුනෙ නෑ. ඒත් අපේ දවසේ වියදම එන්න එන්නම ඉහළ යද්දි මොනවා හරි ව්‍යාපාරයක් කළ යුතුය කියන සිතුවිල්ල ඉබේම ඇතිවුණා.ඒත් ව්‍යාපාරයක් ආරම්භ කරන්න විශාල මුදලක් අපි ලඟ තිබුණෙ නෑ.ඉතාසුළු මුදල් ආයෝජනයකින් පටන් ගත හැකි ව්‍යාපාරයක් පිළිබදව කල්පනා කරද්දි මට හිතුණා මී කිරි මුදවලා අළෙවි කිරීම වැඩි ප්‍රාග්ධනයකින් තොරව ආරම්භ කළ හැක්කක් කියලා.ඒ අනුව මීට අවුරුදු 20කට විතර කලින් තමයි මම මී කිරි මුදවලා අළෙවි කිරීමේ මේ ව්‍යාපාරය පටන්ගත්තේ. අපිට මී හරක් නෑ. මී හරක් ඇතිකරන අයගෙන් මුදලට කිරි ලබාගෙන මුදවලා අළෙවි කිරීම තමයි කරන්නේ. ව්‍යාපාරය තිබුණු මට්ටමින් ඉහළට ගන්න වැඩිපුර මුදල් අවශ්‍ය වුණු වෙලාවක තමයි මට ණය මුදලක් ගන්න තැනක් අවශ්‍ය වුනේ. ඒ පිළිබඳව සොයමින් ඉන්න වෙලාවක තමයි ප්‍රයිම් ග්‍රාමින් සමාගම ගැන මට දැන ගන්න ලැබුණේ. රු. 25.000 ණය මුදල මුලින්ම ලබාගෙන ඊට පස්සෙ 50.000 ණය මුදල ලබා ගත්තා ඉදිරියේදී මී හරක් ඇති කරමින් ව්‍යාපාරය තව දුරටත් දියුණු කර ගන්නයි මගේ බලාපොරොත්තුව. ඒ සඳහා ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ අත්වැල නිරතුරුවම ලැබේය කියන විශ්වාසය මා තුළ තියෙනවා.

**චන්ද්‍රා මාලනී, බටහිර පානම, පානම.**

**ප්‍රධානියාගේ මේසයේ ඇතිදෑ කියවීමෙන් වලකින්න.**

# නව වසරක නව ගමනක්...



**ජොනතන් අලස් මහතා**
**සභාපති - ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස්**

පසුගිය මාස කිහිපය තුළ හැටන් නැෂනල් බැංකුව ප්‍රයිම් ග්‍රාමීන් සමාගම සමග ඇති කර ගත් සම්බන්ධතාවය ගැන ඔබ සියලු දෙනාම හොඳින් දන්නවා. මෙම එකඟතාවය අප ආයතන දෙකටත්, අප රටටත්, පොදුවේ අපි හැමෝටමත් ඉතා වටිනා එකක් බවයි මගේ අවංක හැඟීම. ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව හැටන් නැෂනල් බැංකුවේ අපි සුදුසු මූල්‍ය ආයතනයක් සමග සම්බන්ධ වීමට වසරක පමණ කාලයක සිට කටයුතු ආරම්භ කර තිබුණා. ඔබලාට මතක ඇති 2013 වර්ෂයේ අයවැයෙන් තමයි මෙය මුලින්ම ඉදිරිපත් වුණේ. අපි දැනගත්තා ඒ අවස්ථාවේ ලංකාවේ ප්‍රධාන බැංකුවක් හැටියට අපට අපේ වගකීම ඉෂ්ට කරන්න වෙනවා කියලා. ලංකාවේ මූල්‍ය ආයතන දහයකට වැඩි ප්‍රමාණයක් ගැන අපි ඉතා හොඳින් සොයා බැලුවා. අවසානයේදී අපිට හොඳම මූල්‍ය සමාගම වන ප්‍රයිම් ග්‍රාමීන් සමග සම්බන්ධවීමට හැකිවීම ගැන අපි අද ඉතාමත් සතුටට පත් වී සිටිනවා. ඒ වෙනුවෙන් ප්‍රයිම් ග්‍රාමීන් සමාගමටත් අපිට ඒ සඳහා මග පෙන්වූ ප්‍රයිම් ලෑන්ඩ්ස් සමාගමටත් හැටන් නැෂනල් බැංකුවේ ස්තුතිය මම පුද කරනවා.

හැටන් නැෂනල් බැංකුව තමයි ලංකාවෙ තිබෙන පැරණිතම පුද්ගලික වාණිජ බැංකුව. අපේ බැංකුව අවුරුදු 125 ට වඩා පැරණියි. අපිට ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ අවුරුදු 25ක අත්දැකීම් තියෙනවා. ක්ෂුද්‍ර මූල්‍ය කියන එක හැටන් නැෂනල් බැංකුවට අලුත් දෙයක් නෙමෙයි. අපි කරන ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු සහ සංවර්ධන බැංකු කටයුතු ඔබලාගේ ඒවාට වඩා තරමක් වෙනස්. වසර 25 ක කාලය තුළ අපි ඒ සම්බන්ධයෙන් විශාල දියුණුවක් අත්කරගෙන තිබෙනවා. තවත් අපි එය සංවර්ධනය කරන්නයි බලාපොරොත්තුව. අපි රට පුරා විසිරුණු ශාඛා 250 කින් සමන්විත බැංකුවක්. ලංකාවේ හොඳම පාරිභෝගික බැංකුව' සම්මානය පිට පිට දිනාගෙන තියෙනවා. එම නිසා අපේ සම්බන්ධවීම ආයතන දෙකටම වඩාත් ඵලදායී වෙන වැදගත් අවස්ථාවක් විදියටයි අපි දකින්නෙ.

2011 වර්ෂයේ සිට ප්‍රයිම් ග්‍රාමීන් සමාගමට ඇතිවූ අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමට විසඳුම් ලබාදුන් ප්‍රයිම් ලෑන්ඩ්ස් ආයතනයට අපේ ස්තුතිය පිරිනමනවා. ඒ අභියෝග ජයගන්න ඔබ සියලුදෙනාගෙම කැපවීම වැදගත් වුණා. මගෙ මේ කථාවෙ ප්‍රධාන අරමුණ වෙන්නේ 'ඔබ සමග ඉතාමත් සමීපව කටයුතු කරමින්, අවශ්‍ය නිසි උපදෙස් සහ සහයෝගය ලබා දෙමින්, සමාගමේ කටයුතු අධීක්ෂණය කරමින්, ප්‍රයිම් ග්‍රාමීන් සමාගම තවත් ඉහළ තලයකට ගෙන යන්නට හැටන් නැෂනල් බැංකුව සූදානම් බව මම සහතික කරනවා' කියන පණිවුඩය ඔබට ලබාදෙන එකයි. ප්‍රයිම් ග්‍රාමීන් බැංකුව සතු ආයතනික වටිනාකම්, මානව සම්පත්, සහ ප්‍රයිම් ලෑන්ඩ්ස් ආයතනය අලුතින් එකතු කළ සියලු යහපත් දේ සමගින් හැටන් නැෂනල් බැංකුවේ ශක්තිය, ශාඛා ජාලය, දේශීය හා විදේශීය සම්බන්ධතා හා සියල්ලටමත් වඩා හැටන් නැෂනල් බැංකුවේ නාමය එකට එකතු කරමින් ප්‍රයිම් ග්‍රාමීන් සමාගම ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වාණිජ ආයතනයක් බවට පත් කිරීම අපගේ එකම අරමුණයි.

අපිට වරදින්න විදිහක් නැහැ. අපි සියලුදෙනාම දක්ෂයි. අපිට මෙච්චරයි කරන්න පුළුවන් කියල අපි සීමා වෙන්න හොඳ නැහැ. ඔබ සැමවිටම උද්යෝගය සහ අභිප්‍රේරණය බලාපොරොත්තු වෙන්න ඕනෑ. ඔබට සැම විටම ඔබට ඉහළින් සිටින කෙනාගෙ මග පෙන්වීම ලැබෙන්න ඕනෑ. ඔබ ඔබගේ හෘද සාක්ෂියට අවංකව, ඔබගෙ ආගමට අනුව, ජීවත්වෙනවා නම් ඔබට කවදාවත් වරදින්න විදිහක් නැහැ.

ඔබ දන්නවා 2013 අවුරුද්දෙ අයවැය පිළිබඳව සහ එහිදී අපි සියලු දෙනාටම එකට එක්වෙන්න කිව්වෙ කොහොමද කියන එක ගැන. අපිට ප්‍රයිම් ග්‍රාමීන් සමාගම පිළිබඳ විශ්ලේෂණ, ඇගයීම් කරන්න අවශ්‍ය වුනේ නැහැ. ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ කාර්ය මණ්ඩලය සහ ගනුදෙනුකරුවන් පිළිබඳ සළකා බැලුවහම මෙය අතහරින්න බැරි අවස්ථාවක් බව අපි අවබෝධ කර ගත්තා. මෙම සමාගම සමග කටයුතු කරන්න තෝරාගැනීමේදී හැටන් නැෂනල් බැංකුවේ වැදගත් නිර්ණායකයක් වුනේ අපි එක්ක කටයුතු කරන්න යන පුද්ගලයො කවුද කියන එකයි. අපිට ප්‍රේමලාල් මහතා, සඳමිණි පෙරේරා මහත්මිය, චමින්ද ප්‍රභාත් මහතා සහ තම්බයියා මහත්මිය සමග එක්ව කටයුතු කිරීම ඉතාමත් පහසු දෙයක් වුණා. එම නිසා අපි තීරණය කළා ඔබ සමග හවුල්කාරීත්වයක් ගොඩනගා ගන්න. ඔබ සියලු දෙනාම ප්‍රකාශ කළ ආකාරයට මෙම සමාගම මෙතරම් සාර්ථක මට්ටමකට ගෙන ඒමට ප්‍රයිම් ලෑන්ඩ්ස් ඉටු කළ කාර්යභාරය අපි අමතක කරන්නේ නැහැ. හැටන් නැෂනල් බැංකුව අසාර්ථක වෙලා තියෙන සමාගමක් පවරා ගත්තේ නැහැ. ඒත් ප්‍රයිම් ලෑන්ඩ්ස් සමාගම අසාර්ථක තත්ත්වයේ තිබුණු සමාගමක් තමයි භාර ගත්තේ. ඉන් වසර තුනකට පසුව හැටන් නැෂනල් බැංකුව පවරාගන්නේ ඉතාම ඉහළ මට්ටමේ තිබෙන සමාගමක්. අපි මෙම සමාගමේ කිසිම අඩුපාඩුවක් දකින්නේ නැහැ අපි දකින්නේ හොඳ අවස්ථාවන් පමණයි. ආයෝජකයෙකු සැළකිලිමත් වෙන හැම දෙයක්ම මෙම සමාගමේ අද තියෙනවා. ඔබලාට හොඳ සේවාදායක පදනමක් තියෙනවා. ඔබලාගේ ණය කලඹ සහ තැන්පතු කලඹ වර්ධනය වෙමින් තියෙන්නෙ. ඔබලාගේ කාර්ය මණ්ඩලය මම හිතන්නෙ සමහරවිට මෙම කර්මාන්තයේ ඉන්න හොඳම කාර්ය මණ්ඩලය. ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ කටයුතු කරන සියලු දෙනාම උත්සාහ කරන්නෙ ප්‍රයිම් ග්‍රාමීන් කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් සොරකම් කර ගන්න. නමුත් මම ඔබලා කිසි කෙනකුට යන්න දෙන්නෙ නැහැ. ඔබලාට ඉතා විශාල අවස්ථා සහිත, උසස් අනාගතයක් ලබා දෙන බව හැටන් නැෂනල් බැංකුව සහ ප්‍රයිම් ලෑන්ඩ්ස් පොරොන්දු වෙනවා. මගේ බලාපොරොත්තුව තමයි ඉදිරියේදී මෙය බැංකුවක් බවට පත් කරන එක. ඔබ හැටන් නැෂනල් බැංකුවේ අනුබද්ධ සමාගමක් බවට පත්වීමත් සමග අපි ඔබලාට කිසිදු වෙනසක් නැතිව බැංකු කාර්ය මණ්ඩලයක් හැටියට සළකනවා. මගෙ අපේක්ෂාව අනාගතයේ කවදා හරි අපි ශේෂ පත්‍රයෙහි සහ ස්කන්ධයන්හි නියම ප්‍රමාණයන් අත්කර ගත් විට මේක බැංකුවක් කරලා ඔබ බැංකුවක් ඇතුළෙ වැඩ කරන කාර්ය මණ්ඩලයක් බවට පත් කරන්න. මේ අවස්ථාවේ හැටන් නැෂනල් බැංකුවත්, පෞද්ගලිකවම මමත්, ප්‍රයිම් ලෑන්ඩ්ස් සමාගමටත්, විශේෂයෙන්ම ප්‍රේමලාල් මහතා සහ සඳමිණි පෙරේරා මහත්මියටත්, ප්‍රභාත් මහතාටත් පසුගිය වසර කිහිපය තුළ ඉටු කර ඇති කාර්යභාරය වෙනුවෙනුත්, හැටන් නැෂනල් බැංකුවට මෙම අවස්ථාව ලබා දීමට කටයුතු කිරීම වෙනුවෙනුත් අපගේ කෘතඥතාවය පළ කිරීමට කැමතියි. මම විශ්වාස කරනවා ඔවුන් ඉදිරියටත් මෙම ව්‍යාපාරයේ සාර්ථකත්වය සඳහා ඔවුන්ගේ විශිෂ්ඨ නායකත්වය ලබාදේවි කියලා.

ඒවගේම අධ්‍යක්ෂ මණ්ඩලය ඔබට අවශ්‍ය සෑම සහයෝගයක්ම ලබා දෙමින් ඔබට මග පෙන්වනවා කියන එකත් මම කියන්න කැමතියි. අපි ඔබලාට අවශ්‍යකරන අභිප්‍රේරණය ලබා දෙනවා. ඒත් අපි සැලසුම් කරලා තියෙන්නෙ ඔබලා විසින්ම මෙම සමාගම පවත්වාගෙන යාමට අවස්ථාව ලබා දෙන්න. එම නිසා ඔබ සියලු දෙනාම - කළමනාකරණය, ප්‍රාදේශීය කළමනාකරණය, ප්‍රධාන කාර්යාලය - ඔබ සියලු දෙනාම එකට එකතුවී චමින්ද ප්‍රභාත් මහතා වටා එක්වී, කණ්ඩායමක් හැටියට කටයුතු කරමින්, කර්මාන්තයේ සිදුවෙමින් තිබෙන්නේ මොනවාද යන්න පිළිබඳව දැනුම්වත් වෙන්න. ඊළඟට කුමක්ද කළ යුත්තේ කියල තීරණය කරමින් ඔබ මෙම ව්‍යාපාරය දියුණු කළ





**හොඳ යහළුවන් ඇත් කරගන්න එපා.**

යුතුයි. ඔබලා ක්‍රමෝපායික සැලසුම් සකස් කරලා, එම අරමුණු ඉටුකරගන්න. අපි මොකක්ද කරන්න ඕනෑ කියලා අපිට කියන්න. මෙය දියුණු කිරීමේ වගකීමේ වැඩි කොටසක් ඔබට පවරමින් අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය පමණක් ඉටු කරනවා. අපි දෛනික කළමනාකරණ කටයුතුවලට සම්බන්ධ වෙන්නේ නැහැ. ඔබලා නිසි පුහුණුව සහ උපදෙස් යටතේ, ඔබලාගේ කුසලතාවයන් දියුණු කර ගනිමින්, වඩාත් නම්‍යශීලීව සහ කඩිසර ලෙස ආයතනයට අවශ්‍ය සේවය ලබා දීම සඳහා තව තවත් සංවර්ධනය වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. අපි නිසැකවම ඒ සඳහා අවශ්‍ය සහාය ලබා දෙනවා.

මැදිහත්කරුවකු වෙන්න නෙමෙයි අපට අවශ්‍ය කරන්නෙ. අපිට අවශ්‍ය ඔබලාට දියුණු වීමට අවශ්‍ය උපකාරය ලබා දෙන්නයි. ඒ සඳහා අපිට කරන්න පුළුවන් දේවල් කිහිපයක් තියෙනවා. අපිට අපේ ශාඛා 250 ක ජාලයක් තියෙනවා. ඒ හරහා ඔබලාගේ ගනුදෙනුකරුවන්ට 3000 ක් පමණ වූ අපගේ ඒ.ටී.එම්. යන්ත්‍ර සඳහා ප්‍රවේශය ලැබෙනවා. මම හිතනවා එමගින් ඔබලාගේ අරමුදල් පිරිවැය 50% කින් පමණ අඩු කරගන්න පුළුවන් වෙයි කියලා. ඔබලා දැනට යම් කිසි අනුපාතයකට අරමුදල් ලබා ගන්නවා නම් ඒක දෙතුන් ආකාරයකින්ම විශාල වශයෙන් අඩුවේවි. එකක් තමයි ඔබලාට දැන් හැටන් නැෂනල් බැංකුවේ සහාය ලැබෙන නිසා ඔබලාගේ තැන්පතු ප්‍රමාණය වැඩිකරගැනීමටත් පිරිවැය අඩු කරගැනීමටත් පුළුවන්. මට අනෙකුත් බැංකුවල තියෙන තරගයත් සමග අනුපාත ගලපන්න බැරි නිසා ප්‍රයිම් ග්‍රාමීන් එකට ගනුදෙනු කරුවන්ව එවනවා. මොකද ප්‍රයිම් ග්‍රාමීන් පොලී අනුපාතයන් බැංකු වලට වඩා හොඳ නිසා. දෙවැනි කරුණ තමයි ඔබට ඔබගේ තැන්පතුවලින් පමණක් ක්ෂුද්‍ර මූල්‍ය සඳහා ණය සපයන්න බැහැ. ඔබට ණය ලබා ගැනීමට සිදු වෙනවා. හැටන් නැෂනල් බැංකුව තියෙන නිසා ඔබට එම ණය ඉතා අඩු අනුපාතයන් යටතේ ලබාගන්න පුළුවන්. තුන්වෙනුව, අපි ජාත්‍යන්තර සහයෝගීතාව සහ ණය ලබාගැනීම සළකා බැලුවහොත් ඔබට අවබෝධ වෙයි එම අනුපාතයනුත් සැළකිය යුතු මට්ටමකින් අඩුවෙන බව. සමහර විට ඔබට වඩා පස්ගුණයක් විශාල ඔබගේ තරගකරුවන් පවා අද 7% - 8% වගේ අනුපාතයකට ණය ගන්නෙ. නමුත් හැටන් නැෂනල් බැංකුව ගන්නේ එයින් භාගයක් තරම් අඩු අනුපාතයකට. මෙම ප්‍රතිලාභ නිසා පහසු ණය සහ ඔබට ඉදිරිපත් කළ හැකි වෙනත් නව නිපැයුම් මගින් තරගකාරී ලෙස ඔබගේ ගනුදෙනුකරුවන්ට දැරිය හැකි අනුපාතයන් යටතේ ඔබට සේවා ලබා දිය හැකියි. හැටන් නැෂනල් බැංකුවේ අපේක්ෂාව වන්නේ මෙම සමාගම මෙම වර්ෂයේදී මිලියන 500 ක සහ ඊළඟ වර්ෂ තුනේදී බිලියන එකක ලාභයක් උපදවන තත්ත්වයට ගෙන ඒමයි. ඒ වන විට ඔබ ඔබගේ සාමාජික සහ ගනුදෙනුකාර පදනම දෙතුන් ගුණයකින් වැඩිකර ගෙන තිබේවි. ඒ හරහා ඔබ ක්ෂුද්‍ර මූල්‍ය සේවාදායකයින්ට පුළුල් පරාසයක සේවා සපයනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. සියලු දෙනාම ඔබගෙන් මූල්‍ය සේවා ලබාගෙන ඔබගේ ප්‍රමාණයන් වැඩිවෙමින් විශාල මට්ටමකට පැමිණෙන විට අනෙකුත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ඔබ සමග තරග කරන්න පටන් ගන්නවා. එම නිසා ඔබ විශාල කැපවීමක් ලබා දෙමින් මූල්‍ය පහසුකම්වලින් ඔබ්බට ගිය අගය වැඩිකිරීමක් ලබා දිය යුතුයි. ගනුදෙනුකරුවන් රඳවා ගනිමින් ගනුදෙනුකරුවන් සංඛ්‍යාව වැඩිකරගැනීම අභියෝගයක්. නව නිපැයුම්, වඩා උසස් ගනුදෙනුකාර සේවාව, වඩා උසස් මූල්‍ය කළමනාකරණ උපදේශන සේවාවක් ගනුදෙනුකරුවන්ට සපයාදීම, සහ තාක්ෂණය යොදාගැනීම අත්‍යාවශ්‍යයි. රළු භූමි ප්‍රදේශවල මෝටර්සයිකල් වලින් ගමන් කිරීම ආදී මම දුටු සියලුම ඡායාරූපවලින් මම අවබෝධ කර ගත්තා අපේ ව්‍යාපාර මේ ආකාරයෙන් කටයුතු කරගෙන ගියහොත් සහ කර්මාන්තයේ වෙනසක් සිදු නොවුවහොත් ඔබලාගේ කිසිදු වෙනසක් සිදු නොකර එය ඉටු කරගන්න පුළුවන්. 2018 මාර්තු වන විට ඔබට පහසුවෙන් බිලියන 01 ක මට්ටමට ළඟා වෙන්න පුළුවන්. අපිට තිබෙන අභියෝග මොනවාද? එම අභියෝග තමයි තරගාකාරී බව වැඩිවෙන එක. ක්ෂුද්‍ර මූල්‍ය කියන එකේ තේරුමවත් දන්නෙ නැති අය අද ක්ෂුද්‍ර මූල්‍ය කරන්න යනවා. මේකෙන් ප්‍රතිලාභ ගන්න පුළුවන් කියලා හැම කෙනාම මේකට එන විට තරගකාරී බව වැඩිවෙනවා. දෙවැනි අභියෝගය තමයි මහ බැංකුව වැනි නියාමන ආයතන අපිට කියන්න පුළුවන් අපේ පොලී ප්‍රතිශත අඩු කරන්න කියලා. අපි ඒකට සූදානම් වෙන්න ඕනෑ. ඔබගේ ගනුදෙනුකරුවන් කිහිපවතාවක් කටයුතුවලින් කොටසක් ජංගම බැංකුකරණ සහ වෙනත් විසඳුම් හරහා සිදු කර ගත හැකි නම් ඔබේ කාර්යය සහ ගනුදෙනුකරුවන්ගේ ජීවිතය පහසුකරගන්න පුළුවන් වෙයි කියන එක. ඔබ දියත්කරන්න යන නව පද්ධතිය නිසා ඔබේ ජීවිත තරමක් පහසු වෙයි. ඒකෙන් අදහස් කරන්නෙ නැහැ ඔබට ගෙදර ඉඳන් හැමදේම ජංගම දුරකථනයෙන් කරන්න පුළුවන් කියලා. එමගින් ඔබට නව ගනුදෙනුකරුවන් සමග කටයුතු කිරීමට වැඩි කාලයක් වෙන් කර ගන්න හැකිවෙනවා. අද තිබෙන විශාලතම අවශ්‍යතාවය අරමුදල් යෙදවීම වුනත්, ඉදිරියේදී ක්‍රියාවලි වැඩිදියුණු කිරීම, තාක්ෂණය, මූල්‍ය උපදේශනය, නවෝත්පාදනය ආදිය ඔබ අනාගතයේදී අපේක්ෂාකළ යුතු තරගකාරී වාසි වෙනවා. අනෙක් කැපවීම තමයි ඔබ අරමුදල් පිරිවැය අඩු කළ යුතු වීම.




අපි ප්‍රාර්ථනා කරමු එච්.එන්.බී. ග්‍රාමීන් (H.N.B Grameen) කියන නාමය මෙම කර්මාන්තයේ වැජඹෙමින්, එහි කාර්යසාධනය මෙම කර්මාන්තයේ මෙන්ම සමස්ත මූල්‍ය කර්මාන්තයේම අසමසම එකක් බවට පත් වේවා කියල. ඒ වගෙම ඔබලාට අවශ්‍ය පුහුණුව ලබාදී ඔබව සංවර්ධනය කිරීමටත් අපි කැපවී සිටිනවා. සමාගම උසස්ම මට්ටමෙන් තිබීමට නම් ඔබත් උසස්ම මට්ටමේ සේවයක් ලබා දෙන්න ඕනෑ. දේශීය වෙළඳපොලේ සහ අන්තර්ජාතික වෙළඳපොලේ සිදුවෙමින් තිබෙන්නේ කුමක්ද කියන එක දැන සිටීම ඔබගේ වගකීමක් වෙනවා. ප්‍රභාත් මහතා සමග කටයුතු කරමින් සෑම වර්ෂයකම ඔබට අවශ්‍ය එක් වර්ගයක පුහුණු අයවැයක් පිළිබඳ ඉදිරිපත් කිරීමක් කරන්න. ඔබගේ කුසලතාවයන් උසස් මට්ටමක තබාගෙන ඔබේ ගනුදෙනුකරුවන්ට උසස් මට්ටමේ සේවාවක් ලබා දෙන්න. එච්.එන්.බී. ග්‍රාමීන් එහෙම නැත්නම් ප්‍රයිම් ග්‍රාමීන් අද තිබෙන තත්වයෙන්ම තියාගෙන ඉන්න අපිට කිසිම අදහසක් නැහැ.

ලංකා බැංකුව සහ මහජන බැංකුවටත් වඩා පැරණි, ලංකාවේ පැරණිතම බැංකුව වන අපි විශාල ශේෂපත්‍රයක් සහිතව ඉතාම ශක්තිමත් බැංකුවක්. ඒත් ඔබ දැන ගත යුතුයි අපිත් ගමනක් යමින් ඉන්නවා කියන එක. අපි හැමදාම හැම අවුරුද්දෙම වැඩි වැඩියෙන් සාර්ථකව කටයුතු කරන්න සැලසුම් කරන්නෙ. ඔබ ආඩම්බර වෙයි මෙම කර්මාන්තයේ ශක්තිමත්ම මව් සමාගමක් එක්ක වැඩකරන්න ලැබීම ගැන. අපි ප්‍රයිම් ග්‍රාමීන් ලෙස අද ඉන්න තත්ත්වයට වඩා තව තවත් විශාල සමාගමක් බවට වර්ධනය වීමේ අපේක්ෂාවයි අපිට තියෙන්න ඕනෑ. ඔබ පුද්ගලයින් වශයෙන් හෝ, කණ්ඩායම් වශයෙන් හෝ සමාගම වශයෙන් වෙනත් සමාගම් පවරා ගැනීමට පවා යොමු විය හැකියි. හැටන් නැෂනල් බැංකුවට මේක ඉතාම වැදගත් ව්‍යාපාරයක්. අපි ඉතාමත් උනන්දුයි මේ ක්ෂේත්‍රයට. මම බලාපොරොත්තු වෙනවා ඉතාම ඉක්මණින් ඔබ සමග කථා කරන්න අවස්ථාවක් ලැබෙයි කියලා. ඔබ සියලු දෙනාට සුන්දර හෙට දවසක්

**(08.12.2014 දින ප්‍රයිම් ග්‍රාමින් සමාගමේ නව සභාපති ජොනතන් අලස් මහතා ප්‍රයිම් ග්‍රාමින් කාර්ය මණ්ඩලය අමතා කළ කථාවේ සාරාංශගත සිංහල පරිවර්තනයකි)**

**කරදරයක්වූ අවස්ථාවකදී යහළුවන් හඳුනාගත හැකිය.**

# ග්‍රාමීන් ශක්තියයි ඇගේ දිරියයි



# ව්‍යාපාරය ගින්නෙන් දැවී විනාශ වුණත් අපේ හිතේ හයිය දැවී අළු වුණේ නෑ...

## සුබ්‍රමනියම් පුෂ්පලතා
## ප්‍රයිම් ග්‍රාමීන් ත්‍රිකුණාමලය ශාඛාව

හැත්තෑව අසුව දශකය පිළිබදව අප කා තුළත් ඇත්තේ හොද හා නරක මිශ්‍ර වු මතකයක්. අදටත් ජීවමාන මතකයන් වු නිර්මාණ ගොන්නකට උපත ලබාදෙමින් කලාකෙතේ ස්වර්ණමය යුගයක් අස්වැද්දූවේ හැත්තෑව අසුව දශකයයි. එසේම ලාංකීය ඉතිහාසය පුරා කළු පැල්ලමක් රැඳවු 71 කැරැල්ල සහ 83 ජුලි කලබලයද 70,80 දශකයන් හි ශේෂවු මතකයන් අතර ඉතිහාසගත වී ඇත.සිය දහස් ගොන්නකගේ පිවිතසේම කෝටි ගණනක දේපලද විනාශ මුඛයට ඇඳ දැමු යුගය පිළිබඳව සුබ්‍රමනියම් පුෂ්පලතාටද කියන්නට අපුරු කතාවක් වෙයි.

පුෂ්පලතාගේ උපන්ගම ත්‍රිකුණාමලය. ව්‍යාපාරිකයකු වු පියාගේ සෙනෙහස පුෂ්පලතාටත් ඇගේ නැගණියටත් අහිමි  වන්නේ ඔවුන්ගේ ළදරු වියේදිමයි.පියාගේ අහිමි වීමත් සමග අසරණ තත්වයට පත්වන පුෂ්පලතාලාගේ ජීවිතවලට ඉනික්බිති එකම පිළිසරණය වන්නේ පුෂ්පලතාගේ ලොකු අම්මා සහ ලොකු තාත්තා. ත්‍රිකුණාමලයේ සුප්‍රසිද්ධ ව්‍යාපාරිකයකු වු පී. ජේසුදාසන් පුෂ්පලතා ගේ ලොකුතාත්තා.

“ලොකු තාත්තාට පුතෙකුයි දුවලා දෙන්නෙකුයි හිටියා.ඒ වුනාට එයාලා නංගිටයි මටයි සැලකුවේ එයාලගෙම දූවලා දෙන්නෙකුට වගේ. අපි දෙන්නා සෙන්ට් මේරිස් කොන්වන්ට් එකට යවලා උගන්වන්නත් හැම පහසුකමක්ම සපයන්නත් එයාලා වගබලා ගත්තා.සාමාන්‍යපෙළින් පස්සේ මම පාසැල් ගමන නැවැත්තුවේ ලොකු තාත්තට උදව් වෙන්න ඕන කියන සිතුවිල්ලත් එක්ක. ඒ වෙද්දි “ මරීනා බිස්කට් ” නමින් ලොකු තාත්තා බිස්කට් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන ගියා.ඊට අමතරව අන්නාස් ඉන්ඩස්ට්‍රිස් නමින් බෑග් කර්මාන්ත ශාලාවකුත් එයාට තිබුණා.මරීනා බිස්කට් ඒ කාලේ හුගාක් ජනප්‍රියයි.ඒ ව්‍යාපාර දෙක ඉතාම හොඳ මට්ටමකින් පවත්වාගෙන යන අතරෙ තමයි ලොකු තාත්තා බේකරි ව්‍යාපාරයටත් අත ගැහුවේ. ඒ දවස්වල මම බෑග් කර්මාන්ත ශාලාවේ වැඩවලට ඔහුට උදව් කළා.”

ජීවිතයේදි අපට හමුවනුයේ තැනිතලා කේෂම භූමි පමණක් නොවේ. හසරැල් සේම කඳුලැල්ද තැනිතලා සේම කඳුහෙල්ද ඊට උරුමයි. නිසංසලේ ගලා ගිය පුෂ්පලතාගේ පීවිතයටද මේ ධර්මතාවය පොදුවුවක්. සීමිතවු මිනිසුන් පිරිසකගේ අන්තනෝමතිකත්වය විසින් ජාතක කරන ලද 83 කළු ජුලිය බොහෝ මිනිස් ජීවිතවලට සේම දේපලවලටද විනාශකාරී අවසානයක් උදාකළා. මේ අවධානමට සිංහල ද්‍රවිඩ වෙනසක් නැතිව විවිධ පිරිස් ගොදුරුවෙද්දි ජේසුදාසන්ගේ ව්‍යාපාර වලටද ඉන් ගැලවීමට ඉඩක් ලැබුනේ නෑ. ජේසුදාසන්ගේ බෑග්කර්මාන්ත ශාලාව බිස්කට් කර්මාන්තශාලාව මුළුමනින්ම වැසී යන තත්වයක් කරා ඇද වැටී තිබුණා.

“කරන්ට් නැතිව මේ පළාතේ හුගාක් ව්‍යාපාර ක්‍රියාත්මක කළ නොහැකි තත්වයකට පත්වෙලයි තිබුනේ. ඒ විනාශය අපේ ජීවිතවලට ඉතාම නරක විදිහට බලපෑවා. ලොකුතාත්තා බෑග් ෆැක්ටරියයි බිස්කට් කර්මාන්ත ශාලාවයි දෙකම වහලා දැම්මා.

හැමදේම විනාශවුණත් ජීවිතේ අතරමග දාලා නවතින්න පුළුවන්කමක් අපිට තිබුනෙ නෑ. මුල ඉඳන්ම ආපහු පටන්ගතයුතු තත්වයක් උද්ගතවෙලා තිබුනත් මම හිතුවා නැවතත් ව්‍යාපාරය පටන්ගන්න ඕන කියලා. ලොකු තාත්තගෙන් උදව් ඇතිව අපි ත්‍රිකුණාමලයෙ උසාවි පාරේ අන්නාස් බේකරි නමින් බේකරියයි හෝටලයයි පටන්ගත්තා. බේකරියේ කටයුතු සියල්ලම මගේ අතින් සිදුවෙද්දි හෝටලයේ වැඩකටයුතු කිරීම නංගිට බාරදුන්නා.

බේකරියේ සියළුම වර්ගයේ පාන්, බනිස්, කේක් ආදි කෑම වර්ග හදනවා. ව්‍යාපාරය කරගෙන යද්දි එදිනෙදා වියදමට අවශ්‍ය මුදල් සොයාගැනීම හුගක් කුඩා පරිමාන ව්‍යාපාරිකයන් මුහුණ දෙන ගැටලුවක්. මේ ප්‍රශ්නෙදි බොහොමයක් බැංකු අනුගමනය කරන පිළිවෙතත් ඇත්තටම අපිට ගැටළුවක් වෙලා තියෙනවා. ඒ වගේ මුදල් ප්‍රශ්නෙකින් හෙම්බත්වෙලා ඉන්න වෙලාවක තමයි මට ප්‍රයිම් ග්‍රාමීන් සමාගම ගැන දැනගන්න ලැබුනේ. ප්‍රයිම් ග්‍රාමීන් සමාගම ණය සපයන ක්‍රමය ඉතාම සුහදශීලි කාරුණික එකක්. ඒ වගේම ව්‍යාපාරයේ අවශ්‍යතාවය සලකා බලලා තමයි ඔවුන් ණය මුදල් නිකුත් කරන්නේ.පියවරෙන් පියවර ණය මුදල් ගන්න නිසා අනවශ්‍ය වියදම්වලට යන්න අපිට බෑ. ඒ නිසා ගන්න මුළු මුදලම ව්‍යාපාරයට යොදවන්න අපට සිදුවන්නේ නිරායාසයෙන්. රු 25,000 ණය මුදලෙ ඉදලා 35,000,50,000 ආදි වශයෙන් මම කිහිපවතාවක්ම ණය මුදල් අරන් තියෙනවා. ඒ මුදල් ගත්තේ කෑම වර්ග හදන්න අවශ්‍ය අමුද්‍රව්‍ය ගන්න, බේකරි උපකරණ ගන්න.”

අන්නාස් බේකරියට අමතරව පුෂ්පලතා සතුව ඇති තවත් ජංගම අළෙවි රථ දෙකක් යොදාගෙන ඇය තම ආහාර වර්ග නගරයේ තැන් කිහිපයක අළෙවි කරනු ලබයි - ත්‍රිකුණාමලය නගරවාසින්ට ඉතා හුරුපුරුදු අන්නාස් බේකරියේ කෑම වර්ග තරම් අන්නාස් ව්‍යාපාරයේ කතාන්දරය මිහිරි එකක් නෙවෙයි. එහෙත් විනාශ වු ව්‍යාපාරයට යළි පීවය දෙන්නට තරම් පොහොසත්වු වත්කමක් පුෂ්පලතා සතු වූයෙන් තවත් කිහිපදෙනෙකුට රැකියාවල්ද සපයමින් සාර්ථක ව්‍යාපාරයක් කරගෙන යාමේ හැකියාව ඇයට ලැබුණා. පුෂ්පලතා සතුවු ඒ වත්කම අන්කිසිවක් නොව ඇය සතු ආත්ම ශක්තිය හා අධිෂ්ඨානයම පමණක් බව ඇයගේ ජීවිතය විමසන අපට යළි යළිත් තහවුරු වෙනවා.




සටහන
මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි
ඡායා - ලක්ෂමන් කුමාරතුංග

## micro credit සංකල්පය පිළිබඳ සරල කියැවීමක්





ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගමේ
කළමණාකාර අධ්‍යක්ෂක /
ප්‍රධාන විධායක නිළධාරි
චමින්ද ප්‍රභාත් මහතා සමග
කළ සාකච්ජාවක් ඇසුරිනි.

# මයික්‍රෝ ක්‍රෙඩිට් ක්‍රමවේදයේ ආරම්භය හා විකාශනය.

## 2 කොටස

**මයික්‍රෝ ක්‍රෙඩිට් ක්‍රමවේදයේ ආරම්භය හා විකාශනය පිළිබඳව විමසා බැලීමේදී අපට පෙනීයන එක් ප්‍රධානතම කරුණක් වන්නේ එය අනෙකුත් බොහෝ සංකල්ප සේම ඉතා සෙමින් අත්දැකීම් වලින් ලැබෙන පරිචයන්ට අනුව වෙනස්වීම් වලට ලක්වෙමින් වර්ධනය වූවක් බවයි.**

කණ්ඩායම් ණය ක්‍රමය වර්ධනය වනුයේ විශ්වාසය පදනම් කරගත් කණ්ඩායමක් සාමුහිකව එකිනෙකාට වගකීමකට බැඳී සිටිමින් ඔවුනොවුන්ට ඇපවීමේ පදනම තුළ පිහිටා ව්‍යාපාර සඳහා ණය ලබා ගැනීමෙනි. ( Solidarity Group & Joint liability).

මෙම කණ්ඩායම් ණය ක්‍රමයේ ආරම්භකයන්, එසේත් නැතහොත් නිර්මාතෘන් ලෙස ඉතිහාසය විසින් අපට හඳුන්වාදෙනුයේ ග්‍රාමීන් බැංකුව නමින් බංගලාදේශයේ ආරම්භ කරන ලද ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාදෙන ආයතනය සහ බොලිවියාවේ බැන්කොසෝල්හි පිහිටි (Bancosol) ACCION නම් වූ ආයතනයන්ය.

කණ්ඩායම් ණය ක්‍රමය සාර්ථක වීමේදී ඒ සඳහා අදාල ණය ලබා ගන්නා කණ්ඩායම තුළ වූ සමානතාවයන් ඉතා වැදගත් වූ බවක් පෙනීයයි. එනම් සමාන සමාජ පරිසර තත්වයන්, (කුලය,ජාතිය) සමාන ආදායම් මට්ටම් (Homogeneous Group) ආදී තත්වයන්ගේ සමානත්වය, මෙවන් තත්වයන්ගේ පවතින අසමානතාවයන් කණ්ඩායමේ සාමූහික හැඟීම බිඳදැමීමට හේතුවක් විය හැකි අතර අවසානයේ ණය නැවත අය කර ගැනීමට යෑමේදී ගැටලුකාරි තත්වයන් උද්ගත විය හැකිය. එසේම එය ණය නැවත ගෙවීමේ ප්‍රවනතාවයට බාධාකාරී ලෙස බලපෑ හැකිය. එම නිසා ණය ලබා දෙන කණ්ඩායම් හදුනා ගැනීමේදී ඔවුන්ගේ සමාජ ආර්ථික පසුබිම පිළිබඳව විමසිලිමත් වීම වටී.

මයික්‍රෝ ක්‍රෙඩිට් සංකල්පය ආරම්භක අවදියේදී කණ්ඩායමක් තුළ සභාපති කෙනෙක් ගණකාධිකාරිවරයෙක් සහ භාණ්ඩාගාරිකවරයෙක් වශයෙන් නිලධාරි මඩුල්ලක් පත් කරගෙන සිටි බවක් පෙනේ. කණ්ඩායම කතිකා කරගත් නිශ්චිත දිනයක සහ වෙලාවක රැස්වුණු අතර කණඩායම් රැස්වීම් පවත්වා සාමුහිකව තීරණ ගන්නා ලදී. එසේම ණය ලාභීන් ලබාගත් ණය පිළිබඳව මුළුමනින්ම හෝ කොටස් වශයෙන් පරික්ෂාකර බැලීමක් කරනු ලබන අතර ඔවුන් විසින් පෙරදී ණය ලබාගත් ආකාරය සහ ඒවා ගෙවනු ලැබූ ආකාරය පිළිබඳව එහිදී විභාග කොට බලනු ලැබේ. Aside Test යනුවෙන් හඳුන්වනු ලැබූ එම පරික්ෂණය ණය ලාභීන්ගේ මුල්‍ය විනය පිළිබඳව කරනු ලබන තක්සේරුවකි. ඊට අනුව ණය ලාභියාගේ මුලික ආදායම් තත්වය, ගෙදර ආදායම වියදම අතර වෙනස ආදිය පිළිබඳ සලකා බැලීමක් කොට ගෙදර ආදායමත් වියදමත් අතර වෙනස ගණනය කොට ලැබෙන ඉතිරියෙන් 50% ක් වාරික මුදල ලෙස ගෙවිය හැකිය යන පදනම මත පිහිටා ණය නිකුත් කරනු ලබයි. නිදසුනක් ලෙස ගෙදරක ආදායම 10.000 නම් වියදම 8.000 නම් මේ දෙක අතර වෙනස වූ රු. 2000ක අගයෙන් 50% එනම් රු. 1000 වාරිකයක් ලෙස ගෙවිය හැකි වන අන්දමේ ණය මුදලක් ණය ඉල්ලුම්කරු වෙත ලබාදීමේ පදනමක් එකල විය.

කණ්ඩායම් ණය ක්‍රමයේදී කණ්ඩායමක සිටින පිරිස 3-10 අතර සංඛ්‍යාවක් විය හැකිය. මේ සෑම අයකුම සාමූහික වගකීමකින් බැඳී සිටීම අනිවාර්ය වේ. ලෝකයේ ක්‍රියාත්මක වන අනෙකුත් බොහොමයක් මයික්‍රෝ ක්‍රෙඩිට් ආයතන ණය ලබා දෙනුයේ බැංකුවක් හරහා වීම ලංකාවේ ක්‍රමවේදය හා සාපේක්ෂව බලන කළ විශේෂත්වයකි. ලංකාවේ ණය ලබාදෙනුයේ ෆයිනෑන්ස් සමාගම් හරහා වීම එම වෙනසයි. ඉන්දියාවේ Natard බැංකුව එවන් මයික්‍රෝ ක්‍රෙඩිට් ණය ලබා දෙන බැංකු අතර ප්‍රමුඛ බැංකුවකි.

මයික්‍රෝ ක්‍රෙඩිට් ක්‍රමවේදය ඉදිරියට විකාශනය වෙමින් වර්ධනය වෙද්දී ග්‍රාමීන් බැංකුව පසුකාලීනව ඊට වෙනස් ස්වරූප එක් කිරීමේලා මුලිකත්වය ගත් බවක් පෙනී යයි. ඊට හේතුව වූයේ නැවත නොගෙවීමේ ප්‍රවනතාවයකට ඔවුන් දිගින් දිගටම මුහුණ පෑමයි. 1998 වර්ෂයේ බංගලාදේශයේ ඇති වූ දරුණු ගං වතුර තත්වයක් හේතුවෙන් මෙවන් තත්වයක් උද්ගත වීමේ මුලික ප්‍රවනතාවයක් ඇති වුණා. ඒ සඳහා ක්‍රමවේදයේ වු ඇතැම් දුර්වලතාවන් සේම මයික්‍රෝ ක්‍රෙඩිට් ක්ෂේත්‍රය තුළ වූ තරඟකාරීත්වය ද හේතුවූ බව පෙනීයයි. මේ තත්වයන් සියල්ල විමසා බැලීමෙන් අනතුරුව ග්‍රාමීන් සංකල්පයට නව මුහුණුවරක් එක් කරමින් 2000 වර්ෂයේදී මයික්‍රෝ ක්‍රෙඩිට් සංකල්පයට නව ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබීය. මෙම නව ක්‍රමවේදය හඳුන්වනුයේ “ග්‍රාමීන් 2”යන නමිනි.




# එකොළොස් වන සංවත්සරය සමරමින් පුත්තලම ශාඛාවෙන් සමාජ සත්කාරක සේවා රැසක්






ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගමේ පුත්තලම ශාඛාවට වසර එකොළහක් සම්පූර්ණ වීම නිමිත්තෙන් පසුගිය නොවැම්බර් 28 දින දවස පුරා විවිධ සමාජ සත්කාරක සේවාවන් රැසක් සිදු කිරීමට පුත්තලම ශාඛාවේ නිළධාරී මඬුල්ල විසින් කටයුතු සම්පාදනය කර තිබිණි.

සිය ශාඛාවේ ජන්ම සංවත්සරය වෙනුවෙන් එදින උදෑසන 7.00 ඓතිහාසික තලවිල ශාන්ත ආනා දේවස්ථානයේදී දේව මෙහෙයක් පවත්වා දේව ආශීර්වාදය ලබාගනිමින් දවසේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි ඉනික්බිති නාරක්කල්ලිය රෝමානු කතෝලික විද්‍යාලයේ සහ සිරම්බිඅඩිය මානවේරිය කණිෂ්ඨ විද්‍යාලයේ සිසු දරුවන් වෙනුවෙන් පරිඝනක දෙකක් පරිත්‍යාග කිරීමට කටයුතු කළ පුත්තලම ශාඛාවේ නිළධාරීන් එදින දවසේ ඉතිරි කාල හෝරා කිහිපය වෙන් කළේ තවත් සුවිශේෂී කාර්යයක් වෙනුවෙනි.ඒ කලාඔය වැඩිහිටි නිවාසයේ නිවස්නා වැඩිහිටියන් වෙනුවෙන් දිවා අහාර වේලක් පිරිනැමීමට සහ ඔවුන්ගේ සෞඛ්‍යාරක්ෂණය වෙනුවෙන් අවධානය යොමු කිරීමටය. එදින සවස් වරුවෙහි වැඩිහිටියන් සමඟ විනෝදයෙන් ගත කිරීමට ඉඩ හසර වෙන්කරගත් ඔවුහු ඔවුන්ට සංගීත රසාස්වාදය ලබාදෙමින් වැඩිහිටියන් සමඟ සතුටින් හා සැහැල්ලුවෙන් ගෙවීමට අමතක නොකළහ. ප්‍රයිම් ග්‍රාමින් පුත්තලම ශාඛාව සිය ජන්ම දිනය සැමරූ ආකාරය වඩාත් ප්‍රශංසනීය බැව් මේ අවස්ථාවට සහභාගී වූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ඇනස්ලි ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කළ අතර මේ කටයුතු සඳහා දැරීමට සිදුවූ සියළු පිරිවැය ශාඛාවේ සේවක මණ්ඩලයත් සාමාජිකාවන් සහ ප්‍රධාන ශාඛාවත් එක්ව දැරීමට කටයුතු කළ බව මෙහෙවරට අදහස් දක්වමින් පුත්තලම ප්‍රාදේශීය කළමනාකරු ලක්ෂ්මන් එරාජ් මහතා ප්‍රකාශ කළේය. මෙම අවස්ථාවට ප්‍රයිම් ග්‍රාමින් සමාගමේ සහකාර සාමාන්‍යාධිකාරී ප්‍රභාත් කත්‍රිආරච්චි,ජ්‍යේෂ්ඨ කළමනාකරු දිනේෂ් තරංග,සහකාර කළමනාකරු නුවන් ලක්ෂාන් යන මහත්වරුන්ද සහභාගී වූහ.




## කිරිමැටියාන විද්‍යාබන්දු වැඩිහිටි නිවාසයට වෙන්නප්පුව ශාඛාවෙන් ශීතකරණයක් .....




ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගමේ වෙන්නප්පුව ශාඛාව 2014 වර්ෂාවසානය සමරමින් තවත් අපූරු සමාජ සත්කාරක සේවාවක නියැළුණු බව අපට දැනගන්නට ලැබුණා.මේ පිළිබඳව තොරතුරු දැන ගැනීමට අප කතා කළේ වෙන්නප්පුව ශාඛාවේ ශාඛා කළමනාකරු ඩිලාන් .... මහතාටයි. "අවුරුද්ද අවසාන වෙද්දි අපි එතෙක් නියැලිලා උන් රාජකාරී කටයුතු වලට අමතරව සමාජ සත්කාරක වැඩසටහනක නියැලෙන්නට අපිට උවමනා වුණා අපි මුලින්ම අදහස් කළේ වැඩිහිටි නිවාසයක් සඳහා දිවා ආහාරයක් පිරි නමන්න. ඒ සඳහා අපි තෝරාගත්තේ කිරිමැටියාන විද්‍යාබන්දු වැඩිහිටි නිවාසයයි. අපි දිවා ආහාරය පිරිනැමීම ගැන කතා කරන්න එහි පාලිකාව හමුවෙන්නට ගිය අවස්ථාවේ අපිට දැන ගන්නට ලැබුණා වැඩිහිටිනිවාසයට ශීතකරණයක අවශ්‍යතාව දැඩිව දැනෙමින් තිබෙනා වග. ඒ අනුව අපි තීරණය කළා ඒ වැඩිහිටි නිවාසයට ශීතකරණයක් පරිත්‍යාග කරන්න. මේ සඳහා අපේ ප්‍රධාන කාර්යාලයෙත් අප ශාඛාවේ නිළධාරින්ගෙත් ධන පරිත්‍යාගයන් අප වෙත හිමිවුණා. 2014 දෙසැම්බර් 12 වන දින අපි එම ශීතකරණය විද්‍යාබන්දු වැඩිහිටි නිවාසයට පරිත්‍යාග කළා.

## දේවාභරණ වැඩමවීමේ පෙරහැරට රත්නපුර ශාඛාවෙන් කඩල දන්සැලක්




උඳුවප් පුර පසළොස්වක පොහෝ දින බෞද්ධාගමික ජනතාවට වඩාත් සුවිශේෂී වන්නේ උඳුවප් පොහොයත් සමඟ සිරිපා සමයද ඇරඹෙන නිසයි.එතෙක් පැල්මඬුල්ල ගල්පොත්තාවල විහාරස්ථානයේ තැන්පත් කර තිබූ දේව ප්‍රතිමාව සහ දේවාභරණ සිරිපාමළුව කරා පෙරහැරකින් වැඩමවීම උඳුවප් පොහොය කේන්ද්‍ර කර ගනිමින් සිදු වන තවත් සුවිශේෂී කාර්යයක්. පසුගිය දෙසැම්බර් 05 වන දින සිදු කරන ලද චිරාගත සම්ප්‍රදායානුකූල පෙරහැර මංගල්‍යයට ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගමේ රත්නපුර ශාඛාව සිය දායකත්වය සපයනු ලැබුවේ පෙරහැර සඳහා සහභාගී වූ පිරිස් වෙත කඩල දන්සැලක් පවත්වමින්. එදින පෙ.ව. 10.00 සිට ආරම්භ කරන ලද කඩල දන්සැල රත්නපුර ශාඛාව ඉදිරියෙහි පවත්වන ලද්දේ රත්නපුර ශාඛාවේ ශාඛා කළමනාකරු සහ ශාඛාවේ කාර්ය මණ්ඩලයේ බැතිබර දායකත්වය ඇතිවයි.මෙම අවස්ථාවට ප්‍රාදේශීය කළමනාකරු චමින්ද සම්පත් මහතාද සහභාගී වුණා.

හිස්කරගත් තරමට පුරවාගත හැකිය.



# ව්‍යාපාරික කටයුතු හා බැඳි උපකාරක සේවා

13 කොටස

## කළමනාකරණ මට්ටම්

සංවිධානයක සෑම කළමනාකරුවකුම ඉටු කරන්නේ එක හා සමාන කාර්යයන් නොවේ. සංවිධානය තුළ ඔවුනට හිමිවන තත්ත්වය අනුව කළමනාකරුවන්ට පැවරෙන කාර්යයන් ද වෙනස් වේ. තමන් වගකීමට බැඳෙන සංවිධානමය කාර්යය පරාසය සහ සංවිධානය තුළ ඔවුන්ගේ මට්ටම අනුව කළමනාකරුවන් වර්ග කෙරේ. සාම්ප්‍රදායික වර්ගීකරණයේදී සංවිධානයක සිටින කළමනාකරුවන් පිරමීඩයක හැඩයෙන් ඉදිරිපත් කෙරේ. ඊට හේතුව සාමාන්‍යයෙන් ඉහළ මට්ටමේ කළමනාකරුවන්ට වඩා වැඩි සංඛ්‍යාවක් පහළ මට්ටමේ සිටීමයි. කළමනාකරණ මට්ටම තිරස් අතට විහිදී ඇති ආකාරය පහත 01 රූප සටහනින් දැක්වේ.




01 රූප සටහන

### 01/ ඉහළ / අග්‍ර කළමනාකරණ මට්ටම:-

සංවිධාන ධූරාවලියක ඉහළින්ම පිහිටන මොවුන් උපායශීලි කළමනාකරුවන් ලෙස ද හැඳින්වේ සමස්ත සංවිධානය සම්බන්ධයෙන් වගකීම හොබවන මොවුන් සංවිධානයක ඉලක්ක නිශ්චය කිරීම උපාය මාර්ග හා ප්‍රතිපත්ති තීරණය කිරීම ආයතනයේ සමස්ත ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම හා මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම යනාදී කටයුතු වල නිරත වේ.

### 02/ මධ්‍යම කළමනාකරණ මට්ටම:-

සංවිධානයේ ප්‍රධාන අංශ හෝ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් හැටියට ක්‍රියාත්මක වන්නාවූ කළමනාකරුවන් වේ. මොවුන් අග්‍ර කළමනාකරුවන් වෙත වාර්තා කරන අතර පළමු පෙළ කළමනාකරුවන්ගේ කටයුතු අධීක්ෂණය හා පාලනය සිදුකරයි. අග්‍ර කළමනාකරුවන් විසින් සංවර්ධනය කරන සැලසුම් උපක්‍රම හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා පළමු පෙළ කළමනාකරුවන්ගේ පුහුණුව හා සංවර්ධනය ගැන සොයා බැලීම කරනු ලබයි.

### 03/ පළමු පෙළ කළමනාකරණ මට්ටම:-

කළමනාකරණ නොවන සේවකයින්ගේ කටයුතු අධීක්ෂණය හා පාලනය කිරීමේ නිරත වන එම සේවකයන් හා මධ්‍යම කළමනාකාරුවන් අතර සම්බන්ධීකරණය සිදුකරන කළමනාකරුවන් වේ. මධ්‍යම කළමනාකරුවන්ට අවශ්‍ය තොරතුරු සම්පාදනය සංවිධානයේ දෛනික කටයුතු සුමටව පවත්වාගෙන යාම මධ්‍යම කළමනාකරුවන්ගේ තීරන ක්‍රියාත්මක කිරීම සිදුකරයි.

### කළමනාකරණ කාර්යයන් හා කළමනාකරණ මට්ටම් සම්බන්ධ වන ආකාරය

**02 රූප සටහන අනුව -**

- පළමු පෙළ මට්ටමේ කළමනාකරුවන් වැඩි වශයෙන් මෙහෙයවීමේ කාර්යයේ නිරත වේ
- අග්‍ර කළමනාකරුවන් වැඩි වශයෙන් සැළසුම්කරණයේ නියැලේ
- මධ්‍ය මට්ටමේ කළමනාකාරුවන් සෑම කළමනාකරණ කාර්යකම සමානව නියැලේ
- සෑම කළමනාකරන මට්ටමකම කළමනාකරුවන් පාලන ක්‍රියාවලියේ සමානව නියැලේ
- සංවිධානකරණයේ වැඩි වශයෙන් අග්‍ර කළමනාකරුවන් අනතුරුව මධ්‍ය කළමනාකරණය ද සුළු වශයෙන් පළමු පෙළ කළමනාකරණය ද නියැලේ




02 රූප සටහන



**සඳකැලුම් ජයතුංග,**
**ගණකාධිකාරී,**
**ප්‍රයිම් ග්‍රාමීන්**
**මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ්.**

## නගර ශාඛාවේ අනුග්‍රාහයෙන් ප්‍රයිම් ග්‍රාමින් "අධ්‍යාපන චාරිකා" ජයවර්ධනපුර කලාපයේදී..





ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගම කවදත් සිය කාර්යයන් ඉටුකිරීමේදී සමාජ සත්කාරක සේවාවන් උදෙසා දක්වනුයේ විශේෂ උනන්දුවකි . විශේෂයෙන් දැයේ දරුවන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා ඒ අතරින්ද ප්‍රධාන තැනක් ගනු ලබන විෂය ක්ෂේත්‍රයකි. ශ්‍රී ජයවර්ධන පුර අධ්‍යාපන කලාපයේ පාසැල් හතරක මෙවර සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටි සිසු දරු දැරියන් ඉලක්ක කර ගනිමින් සංවිධානය කරන ලද අධ්‍යාපනික සම්මන්ත්‍රනයක් පසුගිය නොවැම්බර් 27 වන දින බප/ජය/උඩහමුල්ල සිද්ධාර්ථ මහා විද්‍යාලීය ප්‍රධාන ශාලාවේදී ඉතා සාර්ථක ලෙස පවත්වන ලදි.

සිංහල, විද්‍යාව , ගණිතය යන විෂයන් ඉලක්ක කර ගනිමින් පළපුරුදු දේශකයන් විසින් පෙ:ව:8.30 සිට ප:ව:5.30 වනතෙක් මෙම සම්මන්ත්‍රනය පවත්වන ලද අතර මෙහි ආරම්භක අවස්ථාවට ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ් හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තරංග දීපාල් , සහකාර සාමාන්‍යාධිකාරී කමල් ප්‍රියංග සහකාර සාමාන්‍යාධිකාරී පැතුම් සම්පත් කුරේ , ප්‍රාදේශීය කළමනාකරු සුජිත් කුමාර, ජ්‍යේෂ්ඨ කළමනාකරු අනුර උඩවත්ත සහ නගර ශාඛාවේ කළමනාකරු සුරංග නිරෝෂන් යන මහත්වරුන් ඇතුළු නගර ශාඛාවේ නිළධාරීන් සහ උඩහමුල්ල සිද්ධාර්ථ මහා විද්‍යාලීය විදුහල්පතිතුමා සහ සෙසු පාසැල් තුනෙහි විදුහල්පතිවරුන්,ගුරු භවතුන් සහභාගී වූ අතර සම්මන්ත්‍රනය සඳහා උක්ත විෂයන් හදාරනු ලබන සිසු සිසුවියන් සියයකට ආසන්න පිරිසක් සහභාගී වූහ.



**අතට අත දීමේදි පුටුවෙන් නැගිට අතට අත දෙන්න.**

# ප්‍රයිම් ග්‍රාමින් සුහද හමුව දා...

ප්‍රයිම් ග්‍රාමින් සමාගමේ වාර්ෂික සුහද හමුව මෙවර පැවැත්වුණේ 2014.11.12 දින ගල්කිස්සේ මවුන්ට් බ්‍රීස් හෝටල් පරිශ්‍රයේදීය.ප්‍රයිම් ලෑන්ඩ්ස් සමූහයේ සභාපති බී. ප්‍රේමලාල් , උප සභාපතිනි සඳමිණී පෙරේරා සහ ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත්, අධ්‍යක්ෂිකා ක්‍රිෂාන්ති තම්බයියා යන මහත්ම මහත්මීන්ගේ ගෞරවනීය සහභාගීත්වය ඇතිව පැවැත්වුණු මෙම සුහද හමුව සඳහා ප්‍රධාන කාර්යාලයේ සියළුම සේවක මහත්ම මහත්මීන් සහ ප්‍රාදේශීය කළමනාකරුවන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ සහකාර කළමනාකරුවන් සහභාගී වූහ. මෙම සුහද හමුවෙහි රසාලිප්තබව ප්‍රයිම් ග්‍රාමින් සමාගමේ ඒ ඒ අංශයන් මඟින් ඉදිරිපත් කළ විචිත්‍රාංගයන්ගෙන් වඩාත් රසගැන්විණි.එදින සවස සිට මැදියම් රැය ගෙවී යන තෙක් පැවැත්වුණු මෙම සුහද හමුවෙහි විචිත්‍ර මතකයන් රැසක් කැමරා ශිල්පී ලක්ෂ්මන් කුමාරතුංග සහ පත්මකුමාර කොන්තසිංහ යන මහත්වරුන්ගේ කැමරා ඇසට හමුවූයේ මෙසේය.





## Happy Birthday

ජනවාරි පෙබරවාරි මාසයේ උපන්දිනය සමරන
ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ සහෝදර සේවක මහත්ම මහත්මීන් වෙත
අපගේ හෘදයාංගම සුබ පැතුම් මේ සමඟ පිරිනමමු !

| නම | දිනය | ශාඛාව |
|---|---|---|
| සුසිර ප්‍රියලාල් අරංගල මහතා | ජනවාරි 15 | ප්‍රධාන කාර්යාලය |
| තුසිත ඉන්ද්‍රජිත් මහතා | ජනවාරි 15 | ජා-ඇල |
| රනේෂ් සුභසිංහ මහතා | ජනවාරි 15 | වෙන්නප්පුව |
| ක්‍රිෂ්ණකුමාරන් රවේසන් මහතා | ජනවාරි 15 | කන්තලේ |
| අමිල ශානක මහතා | ජනවාරි 15 | හම්බන්තොට |
| සංජීව් බණ්ඩාර මහත්මිය | ජනවාරි 15 | ප්‍රධාන කාර්යාලය |
| ලක්මාල් සෝමරත්න මහතා | ජනවාරි 16 | ප්‍රධාන කාර්යාලය |
| තරිඳු වන්නිනායක මහතා | ජනවාරි 16 | අනුරාධපුර |
| ඉෂාර සංගීත් මහතා | ජනවාරි 16 | වැලිමඩ |
| අමිල හේරත් මහතා | ජනවාරි 17 | ප්‍රධාන කාර්යාලය |
| සුප්පයියා රවි මහතා | ජනවාරි 17 | නාවලපිටිය |
| සුරේෂ් සුබසිංහ මහතා | ජනවාරි 17 | බණ්ඩාරගම |
| දමිත් පුෂ්ප කුමාර මහතා | ජනවාරි 17 | අවිස්සාවේල්ල |
| සුදත් විජේන්ද්‍ර මහතා | ජනවාරි 17 | ප්‍රධාන කාර්යාලය |
| ආර්.උදයකුමාර් මහතා | ජනවාරි 17 | මඩකලපුව |
| චන්දන පුෂ්පකුමාර මහතා | ජනවාරි 18 | වැලිමඩ |
| තරංග රත්නායක මහතා | ජනවාරි 18 | මාතලේ |
| චමින්ද ජානක මහතා | ජනවාරි 19 | රත්නපුර |
| සමීර රංජිත් මහතා | ජනවාරි 19 | වෙන්නප්පුව |
| අශේන් නානායක්කාර මහතා | ජනවාරි 20 | ජා-ඇල |
| වසන්ත පීරිස් මහතා | ජනවාරි 21 | නගර ශාඛාව |
| හේෂිත ගමගේ මහතා | ජනවාරි 21 | ප්‍රධාන කාර්යාලය |
| මනිමරම් විනෝත් මහතා | ජනවාරි 21 | මුලතිව් |
| ෂෙහාන් ශාලිත මහතා | ජනවාරි 21 | වැලිමඩ |
| අසේල බණ්ඩාර මහතා | ජනවාරි 22 | නුවර |
| ලසන්ත රාජපක්ෂ මහතා | ජනවාරි 22 | ප්‍රධාන කාර්යාලය |
| ලසංක මධුෂාන් මහතා | ජනවාරි 22 | හෝමාගම |
| උදිත ප්‍රභාත් මහතා | ජනවාරි 22 | කඩුවෙල |
| නඩේෂපිල්ලේයි වගීසන් මහතා | ජනවාරි 22 | පොතුවිල් |
| ටී ලැම්බර්ට් මහතා | ජනවාරි 23 | මන්නාරම |
| වීරාජ් විදුරංග මහතා | ජනවාරි 23 | මහියංගනය |
| ධර්මත්නම් මනිවානන් මහතා | ජනවාරි 23 | යාපනය |
| සෙල්වා පරන්තන් මහතා | ජනවාරි 23 | නොරොච්චෝලේ |
| උදයසිරි රත්නායක මහතා | ජනවාරි 24 | මොනරාගල |
| ලෙස්ලි දයාලන් මහතා | ජනවාරි 24 | ත්‍රිකුණාමලය |
| දිලිප් තුෂාර මහතා | ජනවාරි 25 | නුවරඑළිය |
| රසික පෙරේරා මහතා | ජනවාරි 25 | නගර ශාඛාව |
| මහේෂ් පෙරේරා මහතා | ජනවාරි 25 | බණ්ඩාරගම |
| මංජුල කොඩිආරච්චි මහතා | ජනවාරි 27 | මාතලේ |
| ගීතක ජයසිංහ මහතා | ජනවාරි 27 | වත්තල |
| දිලිප් චන්දන මහතා | ජනවාරි 27 | හම්බන්තොට |
| ලක්මාල් පීටර්සන් මහතා | ජනවාරි 27 | පදවිය |
| ප්‍රභාශ් ඉන්දිකලාල් මහතා | ජනවාරි 28 | කෑගල්ල |
| මහිල් මුණසිංහ මහතා | ජනවාරි 28 | කුරුණෑගල |
| චානක සඳරුවන් මහතා | ජනවාරි 28 | හලාවත |
| ජයලත් ප්‍රනාන්දු මහතා | ජනවාරි 28 | මොරටුව |
| සිතුම් සඳරුවන් මහතා | ජනවාරි 28 | වත්තල |
| ලක්ෂාන් දයාවංශ මහතා | ජනවාරි 29 | ප්‍රධාන කාර්යාලය |
| අරවින්ද සඳරුවන් මහතා | ජනවාරි 29 | කළුතර |
| ජනක චන්ද්‍රකුමාර මහතා | ජනවාරි 29 | හලාවත |
| සරිත් කවීෂ මහතා | ජනවාරි 29 | ප්‍රධාන කාර්යාලය |
| ඉසුරු ප්‍රසාත් මහතා | ජනවාරි 30 | මතුගම |
| විශ්වනාතන් සුභිර්තනාන් මහතා | ජනවාරි 30 | කල්මුණේ |
| මරීනා සිජානී මෙනෙවිය | ජනවාරි 30 | බණ්ඩාරගම |
| මධුෂංඛ මෙන්ඩිස් මහතා | ජනවාරි 30 | වත්තල |
| උදාරි ධර්මවර්ධන මෙනෙවිය | ජනවාරි 31 | ප්‍රධාන කාර්යාලය |
| රනුක ගජනායක මහතා | පෙබ. 01 | බදුල්ල |
| සෝමසුන්දරම් නිරන්ජන් මහතා | පෙබ. 01 | වව්නියාව |
| ශ්‍රීනාත් උදය කුමාර මහතා | පෙබ. 01 | අම්පාර |
| අසන්ක විමලසූරිය මහතා | පෙබ. 02 | ප්‍රධාන කාර්යාලය |
| ජොන්මේරි ප්‍රතාපන් මහතා | පෙබ. 02 | යාපනය |
| තාරක කලංසූරිය මහතා | පෙබ. 02 | ජා-ඇල |
| වජිර ප්‍රදීප් මහතා | පෙබ. 02 | ප්‍රධාන කාර්යාලය |
| අනුර උඩවත්ත මහතා | පෙබ. 03 | ප්‍රධාන කාර්යාලය |
| සංජීව වීරසිංහ මහතා | පෙබ. 03 | කුරුණෑගල |
| ඇනස්ලි ප්‍රනාන්දු මහතා | පෙබ. 04 | ප්‍රධාන කාර්යාලය |
| රොහාන් පෙරේරා මහතා | පෙබ. 04 | වත්තල ශාඛාව |
| විමුක්ති සඳකැළුම් මහතා | පෙබ. 04 | ගම්පහ |
| රවීන්ද්‍ර අත්තනායක මහතා | පෙබ. 04 | නාවලපිටිය |
| අජිත් රුවන් කුමාර මහතා | පෙබ. 04 | නැදුන්කනේ |
| ඉන්දික සුනිමල් මහතා | පෙබ. 05 | මොනරාගල |
| නාමල් පුෂ්පකුමාර මහතා | පෙබ. 05 | මොරටුව |
| සංජීව ප්‍රියදර්ශන මහතා | පෙබ. 05 | නොරොච්චෝලේ |
| අමිත් කවිසිංහ මහතා | පෙබ. 05 | රත්නපුර |
| අකිල මධුෂංඛ මහතා | පෙබ. 05 | මහියංගණය |
| සංජීව නිෂාන්ත මහතා | පෙබ. 06 | ගම්පහ |
| මහේෂී උදය කුමාරි මෙනෙවිය | පෙබ. 06 | කන්තලේ |
| දිනේෂ් පද්මාල් මහතා | පෙබ. 06 | ප්‍රධාන කාර්යාලය |
| රුමේෂ් මධුරංග මහතා | පෙබ. 06 | හෝමාගම |
| එස් එම් චන්ද්‍රසේන මහතා | පෙබ. 07 | අම්පාර |
| මුදිත් සුරංග මහතා | පෙබ. 07 | රත්නපුර |
| පියුම් චාමර මහතා | පෙබ. 07 | හම්බන්තොට |
| දේවරාජ් ජෙයකුමාර් මහතා | පෙබ. 07 | නුවර එළිය |
| ජී උදයකුමාර මහතා | පෙබ. 08 | ප්‍රධාන කාර්යාලය |
| ජීවන් වීරවර්ධන මහතා | පෙබ. 08 | බලංගොඩ |
| ශානක මධුශංකමහතා | පෙබ. 08 | ප්‍රධාන කාර්යාලය |
| ළහිරු බණ්ඩාර මහතා | පෙබ. 08 | පොළොන්නරුව |
| කේ ප්‍රසාද් මහතා | පෙබ. 08 | මුලතිව් |
| බන්දුල පද්මකුමාර මහතා | පෙබ. 09 | නුවරඑළිය |
| සාගර අතුකෝරාල මහතා | පෙබ. 09 | කුරුණෑගල |
| චානක කුමාර මහතා | පෙබ. 10 | මීගමුව |
| ප්‍රියන්ත ජයසිංහ මහතා | පෙබ. 10 | ගාල්ල |
| කපිල කුමාර මහතා | පෙබ. 10 | නිට්ටඹුව |
| මගේෂ්වරන් අනොෂන් මහතා | පෙබ. 10 | මුලතිව් |
| නිවන්තක සමීර මහතා | පෙබ. 11 | අවිස්සාවේල්ල |
| සජිත් ජයමාන්න මහතා | පෙබ. 11 | අම්බලන්ගොඩ |
| කන්දසාමී ප්‍රභාකරන් මහතා | පෙබ. 12 | නුවරඑළිය |
| අසංක කුමාර මහතා | පෙබ. 12 | මොරවක |
| පරන්සෝති උමාකාන්ත් මහතා | පෙබ. 12 | කල්මුණේ |
| මනොජ් විජේසිංහ මහතා | පෙබ. 13 | නිට්ටඹුව |
| හර්ෂ චරිත් මහතා | පෙබ. 14 | වැලිමඩ |
| දිලූක සංජීව මහතා | පෙබ. 14 | වැලිමඩ |
| නුෂාන් මධුෂංඛ මහතා | පෙබ. 14 | බෙලිඅත්ත |
| මංජුල කුමාර මහතා | පෙබ. 15 | ප්‍රධාන කාර්යාලය |
| සුසන්ත කුමාර මහතා | පෙබ. 15 | අනුරාධපුර |
| ප්‍රදීප ඩයස් මහතා | පෙබ. 15 | ප්‍රධාන කාර්යාලය |

මෙහෙවර
ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්
නො :168 නාවල පාර නුගේගොඩ
ටෙලි : 0112176262 ෆැක්ස් ඃ 0112825843
ඊ-මේල් :- manjula.p@primegrameen.lk
වෙබ් :- www.primegrameen.com

අධීක්ෂණය :- චමින්ද ප්‍රභාත් (කළමනාකාර අධ්‍යක්ෂ /ප්‍රධාන විධායක නිළධාරි)
ප්‍රධාන කර්තෘ :- මංජුල ප්‍රභාත් හෙට්ටි ආරච්චි
පිටු සැලසුම් :- කේ.ඩී. චමිල චින්තක (අර්ජුන ග්‍රැෆික්ස් (පුද්) සමාගම)
පරිඝනක අක්ෂර සංයෝජනය :- උදාරි ධර්මවර්ධන / උදාර ධනංජය
ඡායාරූප ශිල්පී :- ලක්ෂ්මන් කුමාරතුංග